**සැ.යු.**: මෙවර පළවන *ගැසට්* පත්‍රයේ VI වැනි කොටසේ 2026 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,501 - 2026 අගෝස්තු මස 07 සිකුරාදා - 2026.08.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 අගෝස්තු මස 28 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 අගෝස්තු මස 14 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82818 - (2026/08)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත හටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපෙදස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ"

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත සෙසු නිල තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**
**(වෘත්තීය/ වෘත්තීය නොවන)**

1. ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත වෘත්තීය සහ වෘත්තීය නොවන තනතුරු සඳහා ආධුනික සෙබළ සෙබළියන් බඳවාගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් මූලික සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන අතර, ඉන් තෝරාගනු ලබන සියලුම අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් බඳවාගැනීමට පෙර ශ්‍රී ලංකා යුද්ධ හමුදාව මගින් වෛද්‍ය පරීක්ෂණයක් සඳහා යොමු කරවා ඉන් සමත් අයදුම්කරුවන් සහ අයදුම්කාරියන් රෙජිමේන්තු මධ්‍යස්ථාන සමග සම්බන්ධතාවයෙන් යුතුව පිරිස් පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙතින් ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාව වෙත ඇතුළත් කරනු ලබන අතර, එම සුදුසුකම් පහත සඳහන් පරිදි වේ:

**(අ) බඳවා ගැනීමේ මූලික සුදුසුකම්:**

(1) මූලික සුදුසුකම් - පිරිමි:

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | විවාහක/ අවිවාහක බව | : අවිවාහක. |
| (ඇ) | වයස | : වෘත්තීය නොවන සෙබළ (2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 24ට නොවැඩි විය යුතු යි).<br>: වෘත්තීය සෙබළ (2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 26ට නොවැඩි විය යුතු යි). |
| (ඈ) | උස | : අඩි 5යි අඟල් 4ට නොඅඩු (පොලිස් සේවා බලකාය හැර). |
| (ඉ) | බර | : 50 Kg නොඅඩු. |
| (ඊ) | පපුව | : අඟල් 32ට නොඅඩු. |
| (උ) | දෘෂ්ටි තීව්‍රතාවය | : හුරු ඇස 6/6 විය යුතු යි ( උපැස් සහ කාච රහිතව). |
| (ඌ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතු යි. |

(2) මූලික සුදුසුකම් - කාන්තා:

| | | |
|---|---|---|
| (අ) | පුරවැසිභාවය | : ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | විවාහක/අවිවාහක බව | : අවිවාහක. |
| (ඇ) | වයස | : වෘත්තීය නොවන සෙබළ (2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 22ට නොවැඩි විය යුතු යි).<br>: වෘත්තීය සෙබළ (2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු 26ට නොවැඩි විය යුතු යි). |
| (ඈ) | උස | : අඩි 5යි අඟල් 2ට නොඅඩු (පොලිස් සේවා බලකාය හැර). |
| (ඉ) | බර | : 40 Kg  නොඅඩු. |
| (ඊ) | දෘෂ්ටි තීව්‍රතාවය | : 6/6 විය යුතු යි ( උපැස් සහ කාච රහිතව). |
| (උ) | ශරීර ස්කන්ධ දර්ශකය | : 18 $Kg/m^2$ - 25 $Kg/m^2$ ත් අතර විය යුතු යි. |

(3) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය:

| | | |
|---|---|---|
| (අ) | උස | : අඩි 5යි අඟල් 8ට නොඅඩු (පිරිමි).<br>අඩි 5යි අඟල් 4ට නොඅඩු (කාන්තා). |

(ආ) **වෘත්තීය නොවන රාජකාරි:**

(1) මූලික අධ්‍යාපන සුදුසුකම් - 10 ශ්‍රේණිය සමත් වීම හෝ පිරිවෙන් අධ්‍යාපනය 05 ශ්‍රේණිය සමත් වී සිටිය යුතු යි (පොලිස් සේවා බලකාය හැර).

(2) අධ්‍යාපන සුදුසුකම් පොලිස් සේවා බලකාය - අ.පො.ස (සා/පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව සමඟ විෂයන් 02ක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව ආගම සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් සමත්විය යුතු ය.

(ඇ) වෘත්තීය රාජකාරි:

(1) මූලික අධ්‍යාපන සුදුසුකම් - 10 ශ්‍රේණිය සමත් වී සිටීම හෝ 05 ශ්‍රේණිය (පිරිවෙන් අධ්‍යාපනය) සමත් වී සිටිය යුතු යි. තව ද, මූලික සුදුසුකම්වලට අමතරව ජාතික වෘත්තීය නිපුණතා සහතිකය (NVQ) ලබා ඇති අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් පහත සඳහන් පරිදි සලකා බලනු ලබන අතර, එම සහතිකපත් හිමි අයදුම්කරුවන් ද යුද්ධ හමුදාව වෙත වෘත්තීය ආධුනිකයින් ලෙස බඳවාගනු ලැබේ (එක් එක් වෘත්තියට අනුව අධ්‍යාපන සුදුසුකම් වෙනස් විය හැකිය):

(අ) NVQ III - අ.පො.ස. (සා/පෙළ) සමත් වීම හා සමාන වේ.
(ආ) NVQ IV - අ.පො.ස. (උ/පෙළ) සමත් වීම හා සමාන වේ.

(ඇ) **වෘත්තීය රාජකාරි සඳහා තිබිය යුතු සුදුසුකම් හා පළපුරුද්ද:**

(1) **සූප සහයක** - සියලු රෙජිමේන්තු:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03ක වෘත්තීයට අදාළ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(2) රියදුරු (මෝටර් ප්‍රවාහන) - සියලු රෙජිමේන්තු:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බර හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රය සහිත වීම.
(ඈ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක රියදුරු වෘත්තීයට අදාළ මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් සහිත විය යුතුය.
(ඉ) ජංගම අලුත්වැඩියාවන් ගැන දැනුමක් ඇති අය විශේෂ සුදුසුකමක් ඇති අයවළුන් සේ සලකනු ලැබේ.

(3) පරිපාලන සහයක - සියලු රෙජිමේන්තු (ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය හැර):

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් දෙකක් (02) සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.
(ඇ) අවම වශයෙන් මාස 03ක රජයේ හෝ රජයේ ලියාපදිංචි අයතනයක පරිගණක සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියන පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී තිබිය යුතු ය.
(ඈ) අ.පො.ස (උ/පෙළ) සඳහා පෙනී සිටීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ඇති නිපුණත්වය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(4) **ද්‍රව්‍ය කළමනාකරණ සහයක** - සියලු රෙජිමේන්තු (ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය සහ ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකාය හැර):

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් දෙකක් (02) සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.

(*ඇ*) ගබඩාකරු පාඨමාලාවක් හෝ ඊට සමගාමී වෙනත් පාඨමාලාවක්, සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම හා පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

(*ඈ*) ගබඩාකරණය පිළිබඳ මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(5) **වඩු කාර්මික සහායක** - සියලු රෙජිමේන්තු:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(*ඇ*) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03 වෘත්තියට අදාළ පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෘත්තියට අදාළව NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.

(*ඈ*) වඩු කාර්මික වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

(6) **සංස්කෘතික නර්ථන ශිල්පීන්** - සියලු රෙජිමේන්තු:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 22ට නොවැඩි විය යුතු ය.

(*ආ*) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(*ඇ*) පෙරදිග හා අපරදිග සහතිකලත් නර්ථන පාඨමාලා හදාරා තිබීම.

(*ඈ*) ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංස්කෘතික තූර්යවාදක ඛණ්ඩයේ අණදෙන නිලධාරිගේ මූලික සම්මුඛ පරීක්ෂණයෙන් පසු නිර්දේශ මත බඳවා ගැනේ.

(7) **සන්නද්ධ රථ සංඥා වේඩිකරු** - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය සහ ශ්‍රී ලංකා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(8) **සන්නද්ධ රථ රියදුරු** - ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය සහ ශ්‍රී ලංකා යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(*ඇ*) බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍රයක් සහිත වීම.

(*ඈ*) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක රියදුරු වෘත්තියට අදාළ මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් සහිත වීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(9) **කාලතුවක්කු සහාය කාර්මික** - ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් දෙකක් (02) ක් සඳහා සම්මාන සහිතව සිංහල සහ ගණිතය යන විෂයන් ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.

(10) **ක්ෂේත්‍ර ඉංජිනේරු සහායක** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(*අ*) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(*ආ*) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(11) **යන්ත්‍ර ක්‍රියාකරු සහායක -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) රජයේ හෝ පිළිගත් ආයතනයක් වෙතින් පවත්වනු ලැබූ වෘත්තීය පරීක්ෂණයකින් සමත් වී ඇති බවට සහතික පත්‍රයක් තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් ආයතනයක වසර 01ක සේවා කාලයක් අදාළ වෘත්තීයෙහි නියැලී තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(12) **යන්ත්‍ර වෑද්දුම්කරු / වෑද්දුම්කරු -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් ආයතනයක මාස 03කට නොඅඩු වෘත්තීය සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) යන්ත්‍ර වෑද්දුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(13) **ඉදිකිරීම් කාර්මික -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) ඉදිකිරීම් කාර්මික වෘත්තීය පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඉදිකිරීම් කාර්මිකයෙකු වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(14) **රියදුරු (ක්‍රියාකරු) -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා දී ඇති සහතිකය.
(ඈ) රියදුරු ක්‍රියාකරු වෘත්තියේ වසර 01කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

(15) **මූර්ති ශිල්පී -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා දී ඇති සහතිකය.
(ඈ) මූර්ති ශිල්පී වෘත්තියේ වසරක හෝ වසර 02ක පළපුරුද්දක් තිබිය යුතු ය.

(16) **වාහන වායුසමීකරණ ක්‍රියාකරු -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) වාහන වායුසමීකරණ ක්‍රියාකරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(17) **මිනින්දෝරු සහායක -** ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විෂයන් 02ක් සමත් වීම.
(ඇ) රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වසර 01ක පළපුරුද්ද හෝ බලයලත්

මිනින්දෝරුවෙකු යටතේ වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

(18) **ජලනල කාර්මික** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) වෘත්තියට අදාළ රජයේ හෝ පිළිගත් ආයතනයක් වෙතින් සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(19) **කම්බි නැවුම්කරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ඇති බවට පිළිගත් ආයතනයකින් ලබා දී ඇති සහතිකය.
(ඈ) මාස 06ක සේවා පළපුරුද්දක් තිබීම.

(20) **විදුලි කාර්මික** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) සහතිකලත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) විදුලි කාර්මික වෘත්තියේ මාස 6 ක පළපුරුද්ද.

(21) **සැලසුම් ශිල්පී** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය විෂයන් ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් 06 සමත් වීම.
(ඇ) රජයේ කාර්මික විද්‍යාලයක ආධුනික සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම හා රජයේ පිළිගත් ආයතනයක් වෙතින් සැලසුම් ශිල්පය පිළිබඳ සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

(22) **කම්මල්කරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) වෘත්තීයට අදාළ මාස 03කට නොඅඩු සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) කම්මල්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(23) **පැස්සුම්කරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පිළිගත් වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) පැස්සුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(24) **ලෝහ තහඩුකරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06කට නොඅඩු වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) ලෝහ තහඩුකරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් සහිත වීම.

(25) **ද්‍රව්‍ය කළමනාකරණ සහයක** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හා ගණිතය විෂය ඇතුළුව විෂයයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) ගබඩාකරු පාඨමාලාව හා ඊට සමගාමී වෙනත් පාඨමාලාවක් හදාරා තිබීම, සිංහල හා ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම හා පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම හෝ ගබඩාකරණය පිළිබඳ මාස 06ක සේවා පළපුරුද්දක් තිබීම.

(26) **වාහන පින්තාරු සහයක** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ පිළිගත් ආයතනයකින් මාස 03කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම, NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම.
(ඈ) පිළිගත් ආයතනයක් වෙතින් මාස 06ක වාහන පින්තාරු සේවා පළපුරුද්දක් ඇති බවට ලබාදී ඇති සහතිකය.

(27) **වාහන කාර්මික ශිල්පී** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම, NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම.
(ඈ) වාහන කාර්මික ශිල්පී වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(28) **මෙවලම් කාර්මික** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකකට සම්මාන සහිතව සිංහල භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) වෘත්තිය සම්බන්ධව NVQ Level III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා ඇත්නම් අ.පො.ස. (සා/පෙළ) සඳහා පෙනී සිටීම ප්‍රමාණවත් වේ.
(ඈ) අදාළ වෘත්තිය පිළිබඳ රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම
(ඉ) මෙවලම් කාර්මික වෘත්තියේ වසරකට වැඩි පළපුරුද්දක් ලබා තිබීම හෝ NVQ LEVEL III සහතිකයක් ලබා ඇත්නම් මාස 06ක පළපුරුද්ද ප්‍රමාණවත් වේ.

(29) **රියපෙට්ටි සැකසුම්කරු** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
(ඉ) රියපෙට්ටි සැකසුම්කරු වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(30) **ලියවන වඩු කාර්මික (පොදු)** - ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය සහ ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකයක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.
(ඉ) ලියවන වඩු කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(31) **දත්ත ප්‍රවේශ ක්‍රියාකරු** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් (02) ක් සඳහා සම්මාන සහිතව සිංහල, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනීසිටීම සහ ඉංග්‍රීසි භාෂාව සඳහා ඇති නිපුණත්වය විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(32) **දෘඩාංග කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් දෙකක් සඳහා සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් වීම.
(ඇ) රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 03කට නොඅඩු පරිගණක දෘඩාංග හා ජාලකරණ කාර්මිකරණය පිළිබඳ පිළිගත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) දෘඩාංග කාර්මික ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(33) **ගුවන් විදුලි කාර්මික සහ විදුලි පණිවුඩ කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රොනික් හෝ විදුලි සංදේශ කාර්මික සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) පිළිගත් ආයතනයක හෝ සමාගමක ඉලෙක්ට්‍රොනික්, විදුලි සංදේශ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබීම.

(34) **පරිගණක කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට

නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළු විෂයයන් 06ක් සමත් වීම.

(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස 03කට හෝ ඊට වැඩි කාලයක පරිගණක කාර්මික පාඨමාලාවක් (Hardware Network) හෝ ඊට සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) පරිගණක කාර්මික වෘත්තියේ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(35) **ජාලකරණ කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළු විෂයන් 06ක් සමත් වීම.

(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස 03කට හෝ ඊට වැඩි කාල සීමාවක පරිගණක කාර්මික පාඨමාලාවක් (Hardware Network) හෝ ඒ සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) ජාලකරණ කාර්මික වෘත්තියේ ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(36) **ගුවන්විදුලි කාර්මික සහ විදුලි සංදේශ කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) පිළිගත් ආයතනයකින් ඉලෙක්ට්‍රෝනික, විදුලි සංදේශ කාර්මික සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.

(37) **සයිබර් ආරක්‍ෂණ ක්‍රියාකරු** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිතව සිංහල, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වීම.

(ඇ) රජයේ ලියාපදිංචි හෝ පිළිගත් කාර්මික විද්‍යාලයකින් හෝ පරිගණක පුහුණු ආයතනයකින් මාස හයක හෝ ඊට වැඩි කාලයක සහතිකලත් පරිගණක පාඨමාලාවක් (Ms Office, Ms Excel, Ms Power Point, Graphic Designing, Digital Animation , Corel Draw, Special Effects , Crative Designing, 3D Advertising, Web Designing, Auto Cad) හෝ ඒ සමාන පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) වෘත්තිය පළපුරුද්ද හා සයිබර් ආරක්‍ෂණය පිළිබඳව හදාරා තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(38) **ගුවන්විදුලි යන්ත්‍ර ක්‍රියාකරු** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(39) **සංඥා මධ්‍යස්ථාන ක්‍රියාකරුවන් සහ දුරකථන ක්‍රියාකරුවන්** - ශ්‍රී ලංකා සංඥා බලකාය :

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(40) **දුරකථන මාර්ග නඩත්තුකරු** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට

නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(41) **දුරකථන කාර්මික** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(42) **බෙදාහැරීම් ආරෝහක** - ශ්‍රී ලංකා සංඥා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) අයදුම්කරුවන් හට බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සහිතව රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06ක හෝ ඊට වැඩි පළපුරුද්දක් තිබිය යුතුය.

(43) **පින්තාරුකරු (ගොඩනැගිලි)** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) අදාළ වෘත්තීය පිළිබඳව මාස 03ක පාඨමාලාවක් හදාරා තිබීම හෝ අදාළ වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(44) **එන්ජින් සවිකරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) ජනක යන්ත්‍ර හා ජල පොම්ප ක්‍රියාකරවීම හෝ අලුත්වැඩියා කිරීම සම්බන්ධව පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෘත්තිය පිළිබඳ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(45) **විදුලි සවිකරු** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) මෝටර් එතීම පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබීම හෝ NVQ LEVEL III හෝ ඉන් ඉහළ පාඨමාලාවක් හදාරා තිබීම අදාළ වෘත්තියේ මාස 06ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(46) **ලියවන වඩු කාර්මික** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) අදාළ වෘත්තීය පිළිබඳව මාස 03ක පාඨමාලාවක් හදාරා තිබීම හෝ රජයේ ලියාපදිංචි ආයතනයක වෘත්තීය පාඨමාලාවක් හදාරා තිබිය යුතු අතර, අදාළ වෘත්තියේ මාස 06කට නොඅඩු සේවා පළපුරුද්දක් ලබා තිබීම.

(47) **මිණුම් සහයක** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්විය යුතු ය.

(ඇ) රජයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ වසර 01ක පළපුරුද්ද හෝ බලයලත් මිනින්දෝරුවෙකු යටතේ වසර 01ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(48) **වැඩ මූලික (විභායා)** - ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුලුව දෙවරකට නොවැඩි වාර ගණනක දී අපොස (සා/පෙළ) විභාගයෙන් විෂයයන් 04කට සම්මාන සහිතව විෂයයන් 06ක් සමත්විය යුතු ය.
(ඇ) රජයේ කාර්මික විද්‍යාලයක් මගින් පවත්වනු ලබන ජාතික තාක්ෂණික සහතිකය (සිවිල් විදුලි හා යාන්ත්‍රික) (NCT) II වසර විභාගයෙන් සමත්ව තිබීම හෝ ගොඩනැගිලි ඉදිකිරීම් තාක්ෂණික ශිල්පී ජාතික සහතිකය සහ මාස 06ක වෘත්තීය පළපුරුද්ද);

(49) **ද්‍රව්‍ය කළමනාකරණ සහායක (සැපයුම්)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 03ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06කින් සමත් විය යුතු යි.
(ඇ) ද්‍රව්‍ය කළමනාකරණ සහායක වෘත්තිය පිළිබඳව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම.

(50) **සහාය බේකරි ශිල්පී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බේකරි වෘත්තිය පිළිබඳව මාස 06ක පළපුරුද්දක් ලබා තිබීම.

(51) **ගිනි නිවුම්කරු** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයක ගිනි නිවීම පිළිබඳව මාස 03ක පළපුරුද්දක් ලබා තිබීම.

(52) **දන්ත ශල්‍යාගාර සහායක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (උ/පෙළ) ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනම (03) එකවර සමත් වීම හා අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි යන විෂයයන්ට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම.

(53) **හෙද නිලධාරි** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී පහත සඳහන් විෂයන් හදාරා විෂයයන් 03ක් එක්වර සමත් වීම.

(i) ජීව විද්‍යාව විෂය ධාරාවට අයත්: ජීව විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)
(ii) භෞතික විද්‍යා විෂය ධාරාවට අයත්: සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා උසස් ගණිතය යන විෂයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි හැර)

(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි විෂය අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට

නොවැඩි වාර ගණනක දී විෂයන් 06කින් සමත් වීම.

(54) **විද්‍යුත් නිකර්පන රේඛණ සටහන්කරු** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් 02ක් එක් වරකදී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගය සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06කින් සමත් වීම.

(55) **ඛන්තුක රේඛණ ශිල්පී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමර්ථයක් සහිතව භෞතික විද්‍යාව හෝ රසායන විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් 02ක් එක් වරක දී සමත් වීම.
(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගය සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(56) **ශල්‍යාගාර කාර්මික ශිල්පී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් හදාරා විෂයන් 02ක් එකවර දී සමත් වීම.
(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව විෂයන් 06කින් සමත් වී තිබීම.

(57) **වෘත්තීය චිකිත්සක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයන් 02ක් සහිතව විෂයයන් තුනම එක් වරකදී සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරක දී විෂයන් 06කින් සමත් වී තිබීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව සමත් වී තිබීම.

(58) **විකිරණ ශිල්පී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් විෂයන් 02ක් සහිතව විෂයන් තුනම එක් වරකදී සමත් වීම.
(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ

විද්‍යාව ඇතුළුව විෂයන් 04කට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයන් 06කින් සමත් වී තිබීම හා දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව සමත්ව තිබීම.

(59) **වෛද්‍ය සහායක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් 06ක් සමත් වීම හා ඕනෑම විෂයන් 04කට සම්මාන සාමාර්ථ ලබා තිබීම.

(ඇ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ඕනෑම විෂය ධාරාවකින් සමත්ව තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(60) **අක්ෂි තාක්ෂණවේදී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් විෂයන් 02ක් එක්වරක දී සමත් වීම.

(ඇ) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළත්ව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 06කින් සමත් වීම.

(61) **පාසල් දන්ත චිකිත්සක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් විෂයයන් 02ක් සහිතව විෂයයන් 03ක් එකවරක දී සමත් වීම.

(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාවද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් සමත් වීම.

(62) **දන්ත කාර්මික** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් තුනක් (03) එකවර සමත් වීම.

(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ ඉංග්‍රීසි යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

(63) **මහජන සෞඛ්‍ය පරීක්ෂක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය විෂයට සම්මාන සාමර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් 02ක් එක්වරක දී සමත් වීම.

(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් හයකින් (06) සමත් වීම.

(64) **අංගාදේශක හා සෘජුකරණ ශිල්පී** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) තා/කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයෙන් භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව සඳහා සම්මාන සාමර්ථයක් සහිතව කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයන් අතරින් දෙකක් (02) සහිතව විෂයන් තුනක් එක් වරකදී සමත් වීම.
(ඇ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයන්ට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් හයකින් (06) සමත් වීම.

(65) **පරිපාලන සහායක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/ කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයන් හයක් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම හා ඕනෑම විෂයන් හතරකට (04) සම්මාන සාමාර්ථ ලබා තිබීම.
(ඇ) අ.පො.ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් හදාරා සමත්ව තිබීම.

(66) **ද්‍රව්‍ය කළමනාකරණ සහායක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව විෂයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වීම.
(ඈ) ගබඩාකරු පාඨමාලාව හා ඊට සමගාමී වෙනත් පිළිගත් පාඨමාලා, සිංහල හෝ ඉංග්‍රීසි යතුරු ලියනය කිරීම හා පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම හෝ ගබඩාකරණය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතු යි.

(67) **සන්නාලි** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) ඇඳුම් කැපීම, ඇඳුම් මැසීම, පතරොම් සැකසීම පිළිබඳ අවම වශයෙන් මාස 06කට නොඅඩු පළපුරුද්ද තිබීම හෝ වෘත්තියට අදාළව සේවා සහතිකයක් ලබා තිබීම.

(68). **සපත්තු සැදුම්කරු** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුද්ධෝපකරණ බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) පිළිගත් ආයතනයක වෘත්තියට අදාළව මාස 06ක පළපුරුද්ද සහිත සේවා කාලයක් තිබීම.

(69) **වායු සමීකරණ හා ශීතකරණ කාර්මික** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් නිමකර තිබීම හෝ NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍රයක් ලබා තිබීම.
(ඈ) වායුසමීකරණ හා ශීතකරණ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(70) **ඉලෙක්ට්‍රොනික් උපකරණ කාර්මික ශිල්පී** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක පාඨමාලාවක් හදාරා සාර්ථකව නිමකර තිබීම හෝ NVQ LEVEL III හෝ ඉන් ඉහළ සහතිකපත්‍රයක් ලබා තිබීම.
(ඈ) මාස 06කට නොඅඩු වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

(71) **ජීව වෛද්‍ය උපකරණ කාර්මික** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 02ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 06ක් සමත් වීම.
(ඇ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් ඉංග්‍රීසි විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස. (උ/පෙළ) විභාගය සඳහා පෙනී සිටීම විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.
(ඈ) රජයේ හෝ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ ආයතනයක මාස 06කට නොඅඩු කාලසීමාවක සහතිකලත් පාඨමාලාවක් හදාරා තිබීම.
(ඉ) ජීව වෛද්‍ය උපකරණ කාර්මික වෘත්තියේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(72) **අවිගාරක** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(73) **පරිගණක දෘඩාංග ශිල්පී** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයන් 02ක් සඳහා සම්මාන සහිතව සිංහල හෝ දෙමළ භාෂාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයන් 06කින් සමත් වීම.
(ඇ) මාස 03කට වැඩි පරිගණක දෘඩාංග පාඨමාලාවක්, ඉලෙක්ට්‍රොනික් පාඨමාලාවක්, පරිගණක දෘඩාංග සහ ජාලකරණ පාඨමාලාවක් හදාරා තිබීම.
(ඈ) පරිගණක දෘඩාංග කාර්මික හෝ ඉලෙක්ට්‍රොනික් කාර්මික/ පරිගණක ජාලකරණ කාර්මික ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(74) **ආපදා රථ ක්‍රියාකරු (ඒ හා බී වාහන)** - ශ්‍රී ලංකා විදුලි යාන්ත්‍රික ඉංජිනේරු බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.
(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.
(ඇ) බර වාහන හෝ සැහැල්ලු වාහන රියදුරු බලපත්‍ර සහිත රජයේ ලියාපදිංචි ආයතනයක මාස 06කට නොඅඩු රියදුරු වෘත්තියේ පළපුරුද්දක් ලබා තිබීම.

(75) **පරිපාලන සහායක (ගිණුම්)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) ලාන්ස් කෝප්‍රල් (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමාර්ථ 03ක් සහිතව ගණිතය විෂය ඇතුළුව විෂයන් හයකින් (06) සමත් වී තිබීම හා අ.පො.ස. (උ/පෙළ) විෂයයන් දෙකකින් සමත්ව තිබීම (වාණිජ සහ ගණිත අංශයෙන්

සමත් අයවළුන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ).

(ඇ) ශ්‍රී ලංකා ගණකාධිකාරි ශිල්පී ආයතනයේ (AAT) II වන අදියර සමත් වීම හෝ ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා 2 වන වසර සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CASL) විසින් පවත්වනු ලබන විධායක අදියර (Executive Level) සමත් වීම (පැරණි නිර්දේශ යටතේ ගිණුම්කරණ හා ව්‍යාපාර සහතික I - (Certificate In Accounting and Bussiness I) හෝ පදනම් අදියර (Foundation Leval) සමත් වීම හෝ සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පවත්වනු ලබන පදනම් විභාගය (Foundation Exam) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති තාක්‍ෂණික අදියර (Technical Stage) සමත් වීම හෝ සහතිකලත් වරලත් ගණකාධිකාරී ආයතනයේ (CIMA) සහතික අදියර (Certificate Level) සමත් වී තිබීම හෝ පිළිගත් ගණකාධිකරණ වෘත්තිය අධ්‍යාපන ආයතනයක ගණකාධිකරණය පිළිබඳ වෘත්තිය පාඨමාලාවක් හදාරා තිබීම.

(76) **පරිපාලන සහායක (ගිණුම්)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතුය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සම්මාන සාමර්ථ 03ක් සහිතව ගණිතය විෂය ඇතුළුව විෂයන් 06ක් සමත් වී තිබීම.

(ඇ) අ.පො.ස. (උ/පෙළ) විෂයන් දෙකකින් සමත්ව තිබීම. (වාණිජ සහ ගණිත අංශයෙන් සමත් අයවලුන් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ)

(ඈ) ගිණුම්කරණය සම්බන්ධ පාඨමාලා හදාරා තිබීම, පරිගණක ආශ්‍රිතව ඉංග්‍රීසි/ සිංහල භාෂාවෙන් ලිපි සැකසීමේ හැකියාව.

(ඉ) ගිණුම්කරණ ක්ෂේත්‍රයේ පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(77) **කනිෂ්ඨ පරිපාලන සහායක (විගණන)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) ලාන්ස් කෝප්‍රල් (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල සහ ගණිතය විෂය ඇතුළුව විෂයයන් 06ක් සම්මාන සාමාර්ථ 03ක් සහිතව සමත් වීම.

(ඇ) අ.පො.ස.(උ/පෙළ) විභාගය සමත්ව තිබීම. (වාණිජ හා ගණිත අංශයෙන් සමත් අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණික අධ්‍යාපන ආයතනයේ උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා 2 වන වසර සමත් වීම හෝ ශ්‍රී ලංකා ගණකාධිකාරී ශිල්පීය ආයතනයේ (AAT) II අදියර සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය (ICASL) විසින් පවත්වනු ලබන ගිණුම්කරණය හා ව්‍යාපාර සහතිකය I - (Certificate In Accounting and Bussiness I) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති පදනම් විභාගය (Foundation Exam) සමත් වීම හෝ සහතිකලත් කලමණාකරණ ගණකාධිකාරී ආයතනය (CMA) විසින් පවත්වනු ලබන පදනම් විභාගය (Foundation Exam) හෝ පැරණි නිර්දේශය යටතේ පැවති තාක්‍ෂණික අදියර (Technical Stage) සමත් වීම.

(ඈ) පිළිගත් ආයතනයක් වෙතින් පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම හා සිංහල හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පරිගණක වැඩ කිරීමේ හැකියාව අතිරේක සුදුසුකමක් සේ සැලකේ.

(78) **කනිෂ්ඨ පරිපාලන සහායක (විගණන)** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි/කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් සිංහල සහ ගණිතය විෂය ඇතුළුව විෂයන් 06ක් සම්මාන සාමාර්ථ 03ක් සහිතව සමත් වීම හා අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම.

(වාණිජ හා ගණිත අංශයෙන් සමත් අය කෙරහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ)

(ඇ) විගණන/ගිණුම්කරණය සැබැඳි පාඨමාලා හදාරා තිබීම පරිගණක ආශ්‍රිතව ඉංග්‍රීසි/ සිංහල භාෂාවෙන් ලිපි සැකසීමේ හැකියාව.

(ඈ) විගණන ක්ෂේත්‍රයෙහි පළපුරුද්දක් ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(79) **බෑග් පයිප් වාදක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හා බටහිර සංගීත ප්‍රස්ථාර ලිවීමේ/ කියවීමේ හැකියාව.

(80) **අපරදිග තූර්යවාදක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම හා ක්ලැරිනට්, ට්‍රම්පට්, කෝනට්, සැක්සෆෝන්, ට්‍රම්බෝන්, ටියුබා, ඉයුෆෝනියම්, බේස්, හෝන්, ෆෝපුට්, ඩ්‍රම්ස් යන සංගීත භාණ්ඩවලින් 01ක් හෝ කිහිපයක් වාදනය කිරීම සහ සිංහල/ ඉංග්‍රීසි/ දෙමළ හා හින්දි භාෂාවලින් ගීත ගායනා කිරීමේ හැකියාව සහ ඕගන් ගිටාර් ඉතා දක්ෂ ලෙස වාදනය කිරීමේ හැකියාව.

(81) **පෙරදිග තූර්යවාදක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම. වයලින්, වියෝලා, චෙලෝ, සිතාර්, බටනලා, සන්තූර්, එක්ස්රාජ්, මැන්ඩලීන් යන සංගීත භාණ්ඩවලින් 01 ක් හෝ කිහිපයක් වාදනය කිරීමේ හැකියාව සහ සිංහල, ඉංග්‍රීසි, දෙමළ හා හින්දි භාෂාවලින් ගීත ගායනා කිරීමේ හැකියාව සහ ඕගන් ගිටාර් වාදනයේ කිරීමේ හැකියාව.

(82) **කෘෂිකර්ම ප්‍රදර්ශක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශුසම්පත් බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු අතර (කාන්තා) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 22ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) රජයේ පිළිගත් කෘෂිකාර්මික පාසැල් හෝ ආයතනයක් මඟින් සත්ත්ව පාලනය, බෝග වගාව පිළිබඳව පාඨමාලාවක් හදාරා තිබීම විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

(83) **ට්‍රැක්ටර් ක්‍රියාකරු** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) සාමාන්‍ය සෙබළ (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) මූලික අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම.

(ඇ) බර වාහන/ ඉඩම් වාහන පැදවීමේ රියදුරු බලපත්‍රය ලබා තිබිය යුතු ය.

(84) **කෘෂිකර්ම උපදේශක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(අ) සැරයන් (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.

(ආ) අ.පො.ස. (උ/පෙළ) සමත් විය යුතු ය.

(ඇ) වසර 02කට නොඅඩු පූර්ණ කාලීන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවක්

(NVQ LEVEL VI) සහ අවුරුදු 02කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබිය යුතු යි.

(85) **කෘෂිකර්ම ප්‍රදර්ශක** - ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය:

(*අ*) කෝප්‍රල් (පිරිමි) 2026 දෙසැම්බර් 31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 26ට නොවැඩි විය යුතු ය.
(*ආ*) අ.පො.ස. (සා/පෙළ) සමත් විය යුතු අතර, කෘෂිකර්ම ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු (NVQ LEVEL IV) මට්ටමේ පාඨමාලාවක් හෝ ඊට සමාන සහතිකයක් ලබා තිබීම.
(*ඇ*) අවුරුදු 01කට නොඅඩු සේවා පළපුරුද්දක් තිබිය යුතු යි.

**3. සේවා කොන්දේසි:**

(*අ*) පුහුණු කාලසීමාව අවසානයේ (පිරිමි/ කාන්තා) සිට වසර 05 ක් යුද්ධ හමුදා සේවයේ රාජකාරි අනිවාර්යෙන් ඉටුකළ යුතු බැවින් වසර 12ක සේවා කාලයක් සඳහා සේවය කරන්නේ නම් ඉදිරි වසර 07 සඳහා සේවය දීර්ඝ කිරීම සඳහා වූ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වී ඉන් සමත් විය යුතු ය.

(*ආ*) වසර 12ක සේවාකාලය සම්පූර්ණ කරනු ලබන (පිරිමි) සෙසු නිලයන් වසර 22ක් දක්වා සේවය කරනු ලබන්නේ නම් සේවය දීර්ඝ කිරීම සඳහා නැවත වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වී ඉන් සමත් විය යුතු ය.

**4. වැටුප් හා දීමනා, සේවා කොන්දේසි සහ පහසුකම්:**

(*අ*) පුහුණුවීම් කාලසීමාවෙන් පසු ආධුනික සෙබළ සෙබළියන්ගේ මාසික වැටුප රු. 101,297.90 කි. (සියලු දීමනා සහිතව)
(*ආ*) ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදාවේ ආධුනික ආරම්භක නිලයේ සිට විශ්‍රාම යන තෙක් එයට අදාළ වන පහත දැක්වෙන වැටුප් තලයෙහි/ පරිමාණයෙහි තබනු ලැබේ.

| *නිලය* | *මුදල (රු.)* |
|---|---|
| *සාමාන්‍ය සෙබළ* | *101,297.90* |
| *ලාන්ස් කෝප්‍රල්* | *102,665.90* |
| *කෝප්‍රල්* | *104,033.90* |
| *සැරයන්* | *105,619.90* |
| *මාණ්ඩලික සැරයන්* | *107,349.90* |
| *බලලත් නිලධාරි II* | *109,417.90* |
| *බලලත් නිලධාරි I* | *115,684.90* |

(*ඇ*) වැටුප් හා ඉදිරි සේවා කොන්දේසි සම්බන්ධයෙන් පහත සඳහන් රෙගුලාසි සෙසු නිලයන්ට බලපවත්වනු ලැබේ:

(1) යුද්ධ හමුදා වැටුප් සංග්‍රහය.
(2) අංක 939/16 දරන 1996 සැප්තැම්බර් 03 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකර ඇති 1994 අංක 01 දරන සෙබල සේවා නියෝගය.
(3) අංක 528/15 දරන 1988 ඔක්තෝබර් 21 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකර ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බලකා නියෝගය.
(4) 1989 ජුනි 15 වන දින අංක 562/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරනු ලැබූ කළින් කළ සංශෝධිත 1981 යුද්ධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂිත ව්‍යවස්ථා සංග්‍රහය.

**5. අනෙකුත් දීමනා :**

(*අ*) **පහත සඳහන් මාසික දීමනා ගෙවනු ලැබේ:**

(1) සුදුසුකා දීමනා.
(2) නොමිලේ ආහාර හෝ ආහාර දීමනා.
(3) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට වික්ෂේපණ දීමනාව (විවාහක අයවලුන් හට පමණි).
(4) නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනා.

(*ආ*) **පහත සඳහන් පහසුකම්/ දීමනා ගෙවනු ලැබේ:**

(1) ඇතුළත විසීමට නියෝග ලැබ සිටින විට නොමිලේ නේවාසික පහසුකම්.
(2) ගෙවල් කුළී දීමනා.
(3) නොමිලේ නිල ඇඳුම්.
(4) නිවාඩු යෑම සඳහා නිවාඩු දුම්රිය බලපත්‍ර/ බස් ගමන් බලපත්‍ර.
(5) වෛද්‍ය පහසුකම්.
(6) විවාහක නිවාස පහසුකම්.

(7) වාර්ෂික වැටුප් වර්ධක.
(8) සුභසාධක දීමනා/ පහසුකම්.
(9) ගමනාගමන සඳහා රථවාහන පහසුකම්.
(10) රක්ෂණ වන්දි හා මරණාධාර.
(11) ණය පහසුකම්.
(12) විශ්‍රාම වැටුප්.

6. **සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම:**

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදා නිත්‍ය බල හමුදා සේවය සඳහා එක්වීමට සියලු සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් හා අයදුම්කාරියන් යුද්ධ හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථාන මගින් මූලික සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව තෝරාගැනීම සිදුකරනු ලැබේ. ඉහතින් සඳහන් පරිදි එක් එක් වෘත්තිය සඳහා එක් එක් රෙජිමේන්තුවලට ආවේණික ක්‍රමවේදයන්ට අනුව සම්මුඛ පරීක්ෂණ පවත්වන ආකාරය වෙනස්විය හැකිය (උදා. කමාන්ඩෝ රෙජිමේන්තුව හා විශේෂ බලකාය). එසේ තෝරාගනු ලබන අයදුම්කරුවන් වෙතින් ලබා ගන්නා ලිපිලේඛන රෙජිමේන්තු මධ්‍යස්ථාන මගින් පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙත යොමු කිරීමෙන් පසු පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය වෙතින් පරීක්ෂාවකට ලක් කොට සුදුසුකම් සපුරා ඇති සහ ලිපි ලේඛන නිවැරදිව භාරදී ඇති අයදුම්කරුවන් හා අයදුම්කාරියන් පමණක් යුද්ධ හමුදාව වෙත බඳවා ගැනීමට තෝරා ගනු ලැබේ.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන් හා අයදුම්කාරියන්හට වෛද්‍ය පරීක්ෂණ පවත්වනු ලබන ස්ථානය, දිනය සහ වේලාව විද්‍යුත් ලිපිනයට හෝ දුරකථන මාර්ගයෙන් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය රෙජිමේන්තු සම්බන්ධතාවයෙන් සිදුකරනු ලබන අතර, මේ සම්බන්ධයෙන් ඔබ විසින් දරනු ලබන ගමන් වියදම් හෝ වෙන කිසියම් හෝ වියදමක් යුධ හමුදාව මගින් දරනු නොලැබේ.

(ඇ) අයදුම්කරුවෙකු බඳවා ගැනීමට නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද එසේ කළ යුත්තේ ඔහුගේ ඇති සුදුසුකම් හා වෙනත් හැකියාවක් පිළිබඳ අවධානය යොමු කර සහතිකයක් නිකුත් කර දීමෙනි. අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී කවරාකාරයකින් හෝ නුසුදුස්සෙකු තෝරා ගැනීම සඳහා පෙළඹවීම, *නැතහොත්* බලපෑම් කිරීමට උත්සහ දැරීම නොකළ යුතු ය.

(ඈ) ආරක්‍ෂක අංශයන්හි රාජකාරිවල නිරතව සේවයෙන් ඉවත්ව ගිය හෝ වෙනත් හේතූන් මත ඉවත්කරනු ලැබූ පුද්ගලයන්හට නැවත සේවයට එක් වීමට හෝ සේවයට බැඳීමට හැකියාවක් නොමැත.

7. **අයදුම්පත්‍ර** : අයදුම්පත්‍ර මේ සමග ඉදිරිපත් කර ඇති ආකෘතියට අනුව අයදුම්කරුගේම අත් අකුරින් සම්පූර්ණ කර පිරිස් පරිපාලන අධ්‍යක්‍ෂ මණ්ඩලය' ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය, ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය, අකුරේගොඩ පාර, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපැල මගින් හෝ අයදුම්කරු පදිංචි ප්‍රදේශයේ ළඟම ඇති යුද්ධ හමුදා කඳවුරක් වෙත අතින් ගෙනවිත් භාරදිය යුතු වේ. මේ පිළිබඳ වැඩි විස්තර සහ අයදුම්පත www.army.lk වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

8. අනන්‍යතාවය තහවුරු කිරීම : අපේක්‍ෂකයන් විසින් ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද හැඳුනුම්පත හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ මෝටර් වාහන කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රය පිළිගනු ලැබේ.

9. භාෂා අවශ්‍යතා : ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහා විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනත හා සංශෝධන ප්‍රකාරව විධි විධාන ක්‍රියාවේ යෙදවීම සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මතු පවතිනු ලබන ව්‍යවස්ථාවලටද අනුකූලව තෝරාගත් අපේක්‍ෂකයින් ක්‍රියා කළ යුතු වේ.

10. ඉල්ලුම්පත්‍ර සමග පහත සඳහන් සහතිකවල ඡායාපිටපත් එවිය යුතු යි**:**

(අ) උප්පැන්න සහතිකය;
(ආ) අධ්‍යාපන සහතික;
(ඇ) පාසල් හැරයාමේ සහතිකය;
(ඈ) ග්‍රාම නිළධාරි සහතිකය;
(ඉ) පොලිස් නිශ්කාෂණ සහතිකය;
(ඊ) ක්‍රීඩා හා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ සහතික.
(උ) අයදුම්කරු පිළිබඳ දන්නා (චරිත සහතිකයක් නිකුත් කළ හැකි අයකුගෙන්) පුද්ගලයන්ගෙන් මෑතක දී ලබා ගන්නා ලද චරිත සහතික දෙකක් හා අයදුම්කරු අවසන්වරට ඉගෙනුම ලැබූ පාසලේ විදුහල්පතිගෙන් ලබා ගන්නා ලද චරිත සහතිකයක් තිබිය යුතු වේ;
(ඌ) වෘත්තීන්ට අදාළව හදාරනු ලැබූ පාඨමාලා සහතික.
(එ) ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය.

*සටහන:* මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළ වේ. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

**බී කේ ජී එම් එල් රොද්‍රිගෝ**
**ආර්එස්පී එන්ඩීයූ පීඑස්සී අයිජී,**
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2026 ජුලි මස 07 වන දින,
ශ්‍රී ලංකා යුද්ධ හමුදා මූලස්ථානය,
ආරක්‍ෂක මූලස්ථාන සංකීර්ණය,
අකුරේගොඩ පාර,
බත්තරමුල්ල.

* නොගැලපෙන වචන කපා හරින්න.

**වෘත්තීය/ වෘත්තීය නොවන රාජකාරි සඳහා ආධුනික සෙබළ සෙබළියන් බඳවා ගැනීම සඳහා තොරතුරු ලබා ගැනීම**

1. සම්පූර්ණ නම : .........................................................................................................
.........................................................................................................
2. ලිපිනය :.........................................................................................................
.........................................................................................................
3. උපන් දිනය :.........................................................................................................
4. ජාතිය :.........................................................................................................
5. ආගම :.........................................................................................................
6. ස්ත්‍රී/ පුරුෂ භාවය :.........................................................................................................
7. උස :.........................................................................................................
8. පපුවේ ප්‍රමාණය :.........................................................................................................
9. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................................................
10. භාරකරුගේ නම සහ දුරකතන අංකය :.........................................................................................................
11. අධ්‍යාපන සුදුසුකම් :.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
12. ඉගෙනුම ලැබූ පාසල :.........................................................................................................
13. ඉල්ලුම් කරනු ලබන වෘත්තිය :.........................................................................................................
14. ලබා ඇති වෘත්තීය පුහුණු :.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
15. වෘත්තීය පුහුණු ආයතනය සහ කාලසීමා :.........................................................................................................
.........................................................................................................
16. වෘත්තීය නිපුණතාවය අනුව තිබෙන පළපුරුද්ද පිළිබඳ විස්තරය (කාලසීමාවන් සඳහන් කළ යුතුයි) .........................................................................................................
.........................................................................................................
.........................................................................................................
17. මීට පෙර රැකියාවක් කර තිබේනම් එම ආයතනය/ ස්ථානය හා එම රැකියාවේ නිරත වූ කාලසීමා :.........................................................................................................
.........................................................................................................
.........................................................................................................
18. තෝරාගන්නා ලද වෘත්තිය අනුව රාජකාරි කිරීමට ඇති කැමැත්ත :.........................................................................................................
.........................................................................................................
19. ශ්‍රී ලංකාව තුළ රාජකාරි කිරීමට කැමැති ප්‍රදේශ :.........................................................................................................
.........................................................................................................
20. අයදුම්කරන වෘත්තියට අමතරව හදාරා ඇති පාඨමාලාවන් හා වෙනත් සුදුසුකම් :.........................................................................................................
.........................................................................................................
21. ක්‍රීඩා සුදුසුකම් :.........................................................................................................
22. ළඟම පොලීසිය :.........................................................................................................
23. ඡන්ද කොට්ඨාසය :.........................................................................................................
24. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :.........................................................................................................
25. ග්‍රාම නිලධාරි වසම :.........................................................................................................
26. ළඟම තැපැල් කාර්යාලය :.........................................................................................................
27. දුරකතන අංකය :.........................................................................................................
28. විවාහක/ අවිවාහක බව :.........................................................................................................

ඉහත විස්තර නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ........................ ..........................,

ප්‍රකාශකයාගේ අත්සන.

08 - 28

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ නීති නිලධාරී (විධායක නිලධාරී ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ** III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩුව පිරවීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමේ ක්‍රමය :**

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 06 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

**2. අවශ්‍ය සුදුසුකම් :**

**(i) අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම්:**

**ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දී තිබීම.**

**(ii) පළපුරුද්ද:**

**ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර දෙක (02) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිල මුද්‍රාව සහ සහතික කළ දිනය පැහැදිලිව සඳහන් විය යුතු ය.)**

*හෝ*

**ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර දෙක (02) කට නොඅඩු කාලයක පහත සඳහන් කාර්යයන්ට අදාළ පළපුරුද්දක් ලබා තිබීම.**
**(ලේකම් / දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානී විසින් නිකුත් කළ ලිපියකින් සනාථ කර තිබිය යුතු ය.)**

- නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය කටයුතු කිරීම.
- ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු
- අදාළ අණපනත් සම්බන්ධව නෛතික කටයුතු
- පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදනය කටයුතු
- විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු

*සටහන:* **මූලික සුදුසුකම් සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. සේවා කාලය ආරම්භවන හා අවසාන වන දිනය පැහැදිලිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

**(iii) කායික යෝග්‍යතාව :**

- **සෑම අපේක්ෂයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.**

**(iv) වෙනත් සුදුසුකම් :**

- **ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.**
- **අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය (ඒ බව අයදුම්කරු පදිංචි වසමේ ග්‍රාම නිලධාරී වෙතින් මාස 06ක් ඇතුළත ලබාගත් DS 04 සහතිකය සහ තවත් චරිත සහතිකයක් සනාථ කළ යුතු ය).**
- **අයදුම්පත් කැඳවන අවසන් දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.**

**3. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි:**

**(i)** මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට යටත් ය. තනතුරට බඳවා ගෙන වසර

03 ක් ඇතුළත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලට හා විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විධායක නිලධර ගණය (නීති නිලධාරී තනතුර) තනතුර සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධානවලටද ඒවාට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට ද ඔබ යටත්විය යුතු වේ.

(v) අයදුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍ය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍ය වේ.

**4. වයස් සීමාව :**

- **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතු ය.**

**5. වැටුප් පරිමාණය :**

- **අංක 10/2025** දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150-10x2,400-8x2,940-17x3,900- 195,970 (SL 1-2025) වේ.

**6. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.**

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **01** | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **25** |
| | (*අ*) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 25 | |
| | (*ආ*) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්වවිද්‍යාලයක් විසින් ලබාදෙන නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් | 20 | |
| | (*ඇ*) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2025 හි ඇතුළත් විධිවිධාන අනුව පිළිගත් විශ්ව විද්‍යාලයක් විසින් ලබා ගන්නා ලද, | | |
| | • පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | • දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | • පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | • සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (*ඇ*) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය | 05 | |
| | ***සටහන I :*** නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබා දෙනු ලැබේ. | | |
| | *සටහන I :* ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| 02 | **අතිරේක පළපුරුද්ද :**<br><br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම්.<br><br>(see table below)<br><br>*සටහන -*<br><br>**ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.** | | 35 |
| 03 | **තොරතුරු තාක්ෂණය / තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම** | | 10 |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක්** ලෙස හදාරා තිබීම. | 10 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්. | 08 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ ඊට ඉහළ සුදුසුකමක් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ 5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 05 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩ සටහන්වලට සහභාගී වී ලබා ගත් සහතික පත්‍ර (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබා දෙනු ලැබේ.) | 04 | |
| | ***සටහන :*** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | | |

| | නඩු ගොනු කිරීම් (එක් නඩුවක් සඳහා) | අධිකරණය ඉදිරියේ පෙනී සිට කරුණු දැක්වීම සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා) |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 5 |
| අභියාචනාධිකරණය | 2 | 4 |
| මහාධිකරණය | 2 | 3 |
| දිස්ත්‍රික් උසාවි | 4 | 5 |
| විනිශ්චයාධිකාර | 2 | 3 |

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| **04** | **භාෂා හැකියාව** | | **15** |
| | (අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ** ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය. | 15 | |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවල දී (Moot court competitions) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව<br><br><u>කේවල</u><br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම්</u><br>i. ප්‍රථම ස්ථානය/හොඳම කුසලතාව - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>තෙවන ස්ථානය/ වෙනත් කුසලතා - 06 | 12 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් රජය පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500 ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්. | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී හෝ Edexcel හෝ Cambridge උසස්පෙළ විභාගයේදී ඉංග්‍රීසි භාෂාව සඳහා අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 02 ක් ඇතුළත IELTS සමස්ත ලකුණු 6.5 (සෑම විෂයකටම අවම ලකුණු 06 ක් සහිතව) හෝ ඊට ඉහළ, TOEFL-IBT 79 හෝ ඊට ඉහළ, TOEFL -CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ ලබා තිබීම. | 08 | |
| | (ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් රජය පිළිගත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්<br><br>**සටහන :** ඉහළම සුදුසුකමට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 05 | |
| **05** | **සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය :**<br><br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ:<br>○ ශක්තීන් (Strength questions) (ලකුණු 02),<br>○ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව (Situational questions) (ලකුණු 03) හා<br>○ දක්ෂතාව (Competency questions) (ලකුණු 10)<br><br>ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්න වලට ලබා දෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ. | | **15** |
| **එකතුව** | | | **100** |

*සටහන :* සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කරනු ලබන සහතිකපත්වල අදාළ කාල සීමාවන් පිළිබඳව සඳහන් නොවන්නේ නම් එවැනි සහතික පත්‍ර වලට අදාළ කාල සීමාවන් අදාළ ආයතන මගින් ලිඛිතව තහවුරු කරවාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරුගේ වගකීම වේ. එසේ කාලසීමාවක් සඳහන්ව නොමැති සහ කාලසීමාව තහවුරු නොකළ සහතික පත්‍ර ලකුණු ලබා දීම සඳහා සලකා බලනු නොලැබේ.

** මෙහි ප්‍රධාන විෂයයක් ලෙස අදහස් වන්නේ, උපාධියේ මුළු විෂය ඒකක (සම්භාර) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) ආවරණය වන පරිදි හදාරන ලද විෂයක් වේ.

**7. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.

සම්මුඛ පරීක්ෂණයේ දී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායා පිටපත් ගොනු 02කින් ඉදිරිපත් කළ යුතු ය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

(i.) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii.) වලංගු රියදුරු බලපත්‍රය.

**8. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය:**

(i.) අයදුම්පත් 2026.09.07 වැනි දිනට හෝ ඊට ප්‍රථම "ලේකම්, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය, 3 වන මහල, සෙත්සිරිපාය පළමු අදියර, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii.) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව 05 සිට 09 දක්වාත් තෙවැනි පිටුව 10 සිට 11 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

(iii.) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iv.) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයකු/ නීතිඥවරයකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයකු හෝ රු. 82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

(v.) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

(vi.) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**9. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩුව පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ අනනුකූලතාවයක් පරස්පරතාවක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

2026 අගෝස්තු මස 07 දින,
විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත**

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයේ විධායක සේවා ගණයේ III වන ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම.

|  |
|---|
|  |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුල ලියයන්න.)

(සිංහල - 2 / දෙමළ - 3 / ඉංග්‍රීසි - 4) [ ]

සටහන අයදුම් කරනු ලබන මාධ්‍යය වෙනස් කළ නොහැක.

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................
(සිංහලෙන්/දෙමළෙන්) : ..........................................................

1.2 සම්පූර්ණ නම :..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය): ..........................................................
(සිංහලෙන්/දෙමළෙන්) උදා : එම්.ජී.බී.එස්.කේ. ගුණවර්ධන.

1.4 මුලකුරු සමඟ නම : ..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.0 2.1 ස්ථිර ලිපිනය : ..........................................................
(සිංහලෙන්/දෙමළෙන්)

2.2 ස්ථිර ලිපිනය : ..........................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය: (පුරුෂ - 0, ස්ත්‍රී - 1) [ ]

3.2 විවාහක/අවිවාහක බව: (විවාහක - 1, අවිවාහක - 2) [ ]

3.3 උපන් දිනය: වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.4 2026 ............... දිනට වයස: අවුරුදු : [ ][ ][ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

3.5 ජාතික හැඳුනුම්පත් අංකය: [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

4.0 4.1 දුරකථන අංකය : *ස්ථාවර :* [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

*ජංගම :* [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

5.0 අධ්‍යාපන සුදුසුකම් :

- 5.1 උපාධිය ලබාගත් ආයතනය ලබාගත් දිනය

| | | |
|---|---|---|
| ........................... | .................................. | ................................. |
| ........................... | .................................. | ................................. |

6.0 ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු ලෙස දිවුරුම් දුන් දිනය: ....................

6.1 ශ්‍රේෂ්ඨාධිකරණයේ දිවුරුම් දීමෙන් පසු වසර 02 ක සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සම්පූර්ණ කරන ලද දිනය: ....................

6.2 වසර 02 කට නොඅඩු අදාළ නීතිමය කාර්යයන් සම්බන්ධ පළපුරුද්ද සම්පූර්ණ කළ දිනය: .......................

* මුලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

7.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 06 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර :-

7.1 අතිරේක අධ්‍යාපන සුදුසුකම්: ..................................................................................................................
..................................................................................................................

7.2 අතිරේක වෘත්තීය පළපුරුද්ද: ..................................................................................................................
..................................................................................................................

7.3 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම: ..................................................................................................................
..................................................................................................................

7.4 භාෂා හැකියාව: ..................................................................................................................
..................................................................................................................

8.0 ඔබ උසාවියකින් වරදකරු කරනු ලබා තිබේද? (ඔව් / නැත)
(ඔව් නම් විස්තර කරන්න)
..................................................................................................................................................

9.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

| | |
|---|---|
| ............................... | ..............................................., |
| දිනය. | අයදුම්කරුගේ අත්සන. |

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..................................................................මහතා/මහත්මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන තැබූ බවත් සහතික කරමි.

...................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම

තනතුර:

දිනය:

(නිල මුද්‍රාව තබන්න)

11.0 දෙපාර්තමේන්තු ප්‍රධානීගේ නිර්දේශය (රාජ්‍ය සේවයේ නියුක්තිකයින් සඳහා පමණි)

ඉහත විස්තර සඳහන් ............................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවත් සහතික කරමි.

............................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානීගේ අත්සන.

නම :
පදවි නාමය :
ලිපිනය :
දිනය :
(නිල මුද්‍රාව තබන්න)

08 - 97

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වෙබ් ලේඛක MN 2 - 2025 (කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන - බහුකාර්ය බණ්ඩ I සේවා ගණය සඳහා) බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම සංශෝධනය කිරීම.

**2026.03.20 වැනි දිනැති අංක 2,481 දරන *ගැසට් නිවේදනයේ* පළ කරන ලද රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වෙබ් ලේඛක තනතුර සඳහා වන බඳවා ගැනීම් නිවේදනයේ අංක 4 හි සඳහන් වන වෘත්තීය සුදුසුකම් පහත දැක්වෙන ආකාරයට නැවත සංශෝධනය කරනු ලැබේ.**

***වෘත්තීය සුදුසුකම් :*** **තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් අනුමත ආයතන විසින් පිරිනමනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.**

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අනුමත ආයතනයකින් ලබා ගන්නා ලද ජන සන්නිවේදනය පිළිබඳ ඩිප්ලෝමාවක් ලබා තිබීම හෝ ජන සන්නිවේදන ක්ෂේත්‍රයේ ඊට ඉහළ සුදුසුකමක් ලබා තිබීම.

02. අදාළ අයදුම්පත්‍රය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.dgi.gov.lk) බාගත කර ගත හැකිය. එහි දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, නියමිත විභාග ගාස්තු ගෙවූ රිසිට් පත ද අලවන ලද, අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් ද, සමග 2026 අගෝස්තු මස 24 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, කිරුළපන මාවත, කොළඹ 05 ය ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්කරන තනතුර ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතු ය.

03. 2026.03.20 වැනි දිනැති අංක 2,481 *ගැසට්* නිවේදනයේ සඳහන්ව තිබූ වෘත්තීය සුදුසුකම් සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් නැවත අයදුම්කිරීම අවශ්‍ය නැත.

**එච්. එස්. කේ. ජේ. බණ්ඩාර,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2026, ජූලි මස 28 වැනි දින,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන මාවත, කොළඹ 05.

08 - 04

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක / පර්යේෂණ සහකාර / පස් සමීක්ෂක තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක / පර්යේෂණ සහකාර/ පස් සමීක්ෂක තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා පැවැත්වෙන විවෘත තරග විභාගයට පහත සඳහන් සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.09.04 වන අතර, එදිනට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

ඒ අනුව 2008.09.04 දිනට හෝ ඊට පෙර හා 1991.09.04 දිනට හෝ ඊට පසු උපන් දිනට යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.
(තව ද ඉහත දින වකවානු පහත උදාහරණයේ පරිදි ගණනය කර යෙදිය යුතු ය.)

*උදා :* 2025.03.31 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 35ට නොවැඩි විය යුතු නම්, අයදුම් කළ හැක්කේ 2007.03.31 දින හෝ ඊට පෙර හා 1990.03.31 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණි.)

| *ඛාණ්ඩය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| *I ඛාණ්ඩය* | *කෘෂිකර්ම උපදේශක* | *257* |
| | *පර්යේෂණ සහකාර* | *70* |
| *II ඛාණ්ඩය* | *පස් සමීක්ෂක* | *02* |

- දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් හා සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

- අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services " යටතේ ඇති " Online Applications – Recruitment Exams / E.B Exams "ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026.08.10** වැනි දින පෙ.ව. 9.00ට විවෘත වන අතර **2026.09.04** වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.

- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**02.1 විවෘත පදනම මත බඳවා ගැනීම**

02.01.1

| *තනතුර* | *02.01.2 අධ්‍යාපන සුදුසුකම්* | *02.01.3 වෘත්තීය සුදුසුකම්* | *පළපුරුද්ද* |
|---|---|---|---|
| | *අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)* | | |
| 1.කෘෂිකර්ම උපදේශක<br>2.පර්යේෂණ සහකාර<br>3.පස් සමීක්ෂක | සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍ය සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) විභාගය සමත්වීම<br>*සහ* | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් මඟින් පිරිනමනු ලබන ද්‍ වි අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව<br>*හෝ* | අදාළ නොවේ. |

| තනතුර | 02.01.2 අධ්‍යාපන සුදුසුකම් | 02.01.3 වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|
| | අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) | | |
| | අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, භෞතික විද්‍යාව, සත්ත්ව විද්‍යාව, ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව යන විෂයයන් අතුරින් විෂයයන් දෙකක් ඇතුළුව විද්‍යාව හෝ තාක්ෂණවේදය විෂය ධාරාවෙන් විෂයයන් (03) ක් එකවර සමත් වී තිබීම. ( සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර ) | රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කිරීම;<br><br>හෝ<br><br>උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. | අදාළ නොවේ. |

02.1.4 **වෙනත් සුදුසුකම් -**

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් එම තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් යෝග්‍ය කායික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
- යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන අයකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

03. සේවයට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අයදුම්පත් භාරගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

04. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ පිරවීමට හෝ නොපිරවීමට හෝ පත්වීම් බලධාරියාට බලය ඇත.

**වැටුප් හා කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය }**

වැටුප් කේත අංකය - MN 03/2025
වැටුප් පරිමාණය - රු.52250 - 800x10 - 1190x11 - 1320x10 - 1350x10 – රු. 100,040/-

III ශ්‍රේණියට බඳවා ගෙන වසර 3ක් ඇතුළත පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද II වන ශ්‍රේණියට උසස්වී වසර 3ක් ඇතුළත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය ද I වන ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගතවීමට පෙර කළමනාකරණය පිළිබඳ ත්‍රෛමාසික පුහුණු පාඨමාලාව ද සමත්විය යුතු ය. පත්වීම්ලාභීන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හා ඊට ආනුෂංගික

චක්‍රලේඛ විධිවිධාන අනුව නියමිත කාලය තුළ අදාළ මට්ටමේ රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. මෙම රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා නොගැනීම හා කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත කාලය තුළ සමත් නොවීම ඉදිරි වැටුප් විලම්භනය වීමට හේතුවනු ඇත.

**05. සේවය නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක වී ඇත්නම් නැවත දායක විය යුතු නොවේ. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

II. නියම කරනු ලබන දිවයිනේ කවර ප්‍රදේශයක වුව ද සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

III. අංක 1930/12 දරන 2015.09.01 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත දැනට බලාත්මක ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ හා බඳවා ගැනීම් පටිපාටිවල සංශෝධනවලට ද ඔබ යටත් විය යුතු ය.

**06. අයදුම්කළ යුතු ක්‍රමය**

**(අ)** මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E–Mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) මෙම තනතුරු පහත පරිදි බාණ්ඩ ගත කරනු ලැබේ.
I බාණ්ඩය - කෘෂිකර්ම උපදේශක / පර්යේෂණ සහකාර
II බාණ්ඩය - පස් සමීක්ෂක
තනතුරු කිහිපයක් සඳහා අයදුම් කරන්නේ නම් ප්‍රමුඛතා අනුපිළිවෙළ අයදුම්පතේ සඳහන් කළ යුතු වේ.

(ඇ) විභාග ගාස්තුව රු. 1200.00 කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

I. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

II. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);

III. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය මඟින් / "Flex "යෙදවුම මගින් (Online Banking Method / "Flex"App of Bank of Ceylon);

IV. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

***සටහන :***

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදල ම ගෙවිය යුතු අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

07. **විභාග පටිපාටිය :**

(අ) *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග

සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

(ආ) අයදුම්කරුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ.

(ඇ) විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරීලත් නිලධාරියකු, රජයේ හෝ රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර ලබා දෙනු නොලැබේ.

(ඈ) විභාග අපේක්ෂකයන් /අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගුවේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකිවන පරිදි මුහුණු ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගනු ඇත. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවෙන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

(ඉ) මෙම විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක / අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඊ) විෂය නිර්දේශය -

1. බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1 යි, මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකුලත්වය, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.
2. විෂයානුබද්ධ දැනුම (කාලය පැය 2 යි, මුළු ලකුණු 100)
අපේක්ෂකයාගේ විෂයානුබද්ධ දැනුම පිළිබඳ ව්‍යූහගත ප්‍රශ්න හා බහුවරණ ප්‍රශ්නවලින් යුක්ත ප්‍රශ්න පත්‍රයකි

| *අනු. අංකය* | *තනතුර* | *විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය* |
|---|---|---|
| 1<br><br>2 | කෘෂිකර්ම උපදේශක<br><br>පර්යේෂණ සහකාර | ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂිකර්මාන්තයේ දායකත්වය / ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප පිළිබඳ දැනුම / පස හා ශාක පෝෂණය/ වී නිෂ්පාදනය/ වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය / එළවළු නිෂ්පාදනය / පළතුරු නිෂ්පාදනය / ජල වහනය හා එහි වැදගත්කම/ බෝග ආරක්ෂණය / පාංශු සංරක්ෂණයේ වැදගත්කම හා විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම / වාරි මාර්ග හා ජල කළමනාකරණය / ගොවිපල් යාන්ත්‍රිකරණය / මී මැසි පාලනය / මල් වගාව හා භූමි අලංකරණය / ආරක්ෂිත බෝග වගාව / සත්ව පාලනය / කෘෂි කාර්මික ව්‍යාප්තිය / පටක රෝපණය / පැළෑටි නිරෝධායනය / ශාක සංරක්ෂණය හා එහි වැදගත්කම / ජෛව තාක්ෂණය /කෘෂි සංවර්ධනය |

| අනු. අංකය | තනතුර | විෂයානුබද්ධ දැනුම ප්‍රශ්න පත්‍රයේ විෂය නිර්දේශය |
|---|---|---|
| 3 | පස් සමීක්ෂක | i. ශ්‍රී ලංකාවේ පස් වර්ග හා ඒවායේ පැතිරීම<br>ii. පස සෑදීමට බලපාන සාධක, පාංශු පැතිකඩ හඳුනා ගැනීම<br>iii. සිතියම් කියවීම<br>iv. ශ්‍රී ලංකාවේ වර්තමාන ඉඩම් පරිහරණ රටාව<br>v. වන විනාශයේ බලපෑම හා පාරිසරික ගැටලු<br>vi. පොහොර භාවිතය<br>vii. බෝග විවිධාංගීකරණය<br>viii. පාංශු ජල සංරක්ෂණ ක්‍රම |

(උ) මාධ්‍යය -
විභාගය පැවැත්වෙන්නේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලිනි. අපේක්ෂකයන් විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම මාධ්‍යයකින් පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ඌ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත්වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

(එ) විභාගය පවත්වන ස්ථානය හා දිනය :

මෙම විභාගය **2026 නොවැම්බර්** මාසයේ දී කොළඹ දී හා මහනුවර දී විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ. යම් හෙයකින් ප්‍රමාණවත් අපේක්ෂක සංඛ්‍යාවක් ඉදිරිපත් නොවුවහොත් කොළඹ දී පමණක් විභාගය පැවැත්වීමට කටයුතු කරනු ඇත. (ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.) විභාග අයදුම්කරුවන් තමන්ට නියම කරන විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු ය.

| විභාග මධ්‍යස්ථානය | සංකේත අංකය |
|---|---|
| කොළඹ | 1 |
| මහනුවර | 2 |

**08. බඳවා ගැනීමේ ක්‍රමය :**

I. ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් මුළු ලකුණු කුසලතාව මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් වෙත ලබා දීමෙන් අනතුරුව ඔහුගේ එකඟතාව ලැබුණු පසු විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළ කිරීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව පියවර ගනු ඇත.

II. ඉහත විභාගයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයට ලකුණු 40% හෝ ඊට වැඩියෙන් ලැබූ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු එකතුව අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනය මත බඳවා ගැනීම් සඳහා සලකා බලනු ලැබේ.

III. කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් මෙම විභාගයේ ලකුණු කුසලතා අනුපිළිවෙළ පදනම් කර ගෙන අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරා ඇති අය පමණක් පුරප්පාඩු සඳහා තෝරාගනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු පිරිනමනු නොලැබේ.)

IV. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

V. තනතුර සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

VI. නිවේදනයේ සඳහන් සුදුසුකම්, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට සම්පූර්ණ කර නොමැතිව තිබිය දී විභාගයට ඉදිරිපත්ව විභාගය සමත් වුව ද සම්මුඛ පරීක්ෂණය සඳහා සලකා නොබලන අතර කිසිදු දැනුම් දීමකින් තොරව ඔහුගේ / ඇයගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

VII. ව්‍යාජ තොරතුරු හා කූට ලේඛන ඉදිරිපත් කර යම් අයකු පත්වීමක් ලබාගත්තේ වුව ද ඒ බව අනාවරණය වූ වහාම ඔහුගේ / ඇයගේ පත්වීම අවලංගු කිරීමට හා ඔහුට / ඇයට විරුද්ධ නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවර ගනු ලැබේ.

09. මෙම නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

10. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක / පර්යේෂණ සහකාර / පස් සමීක්ෂක තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026**

**Department of Agriculture**

**Application for Open Competitive Examination for Recruitment to Posts of Agriculture Instructor/ Research Assistant / Soil surveyor in the Grade III of the Sri Lanka Technological Service –2026**

01. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය - සිංහල - 1
දෙමළ - 2
ඉංග්‍රීසි - 3

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. විභාගයට පෙනී සිටින විභාග මධ්‍යස්ථානය - කොළඹ- 1
මහනුවර- 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

03. ඉල්ලුම් කරනු ලබන තනතුර

කෘෂිකර්ම උපදේශක - 1
පර්යේෂණ සහකාර - 2
පස් සමීක්ෂක - 3

| *තනතුර* | *අංකය* |
|---|---|
| | |
| | |
| | |

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. නම

4.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :......................................................................................

(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

4.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම් වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(උදා: GUNAWARDHANA, H.M.S.K) ..............................................................
4.3 සම්පූර්ණ නම : ..............................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

4.4 ජාතික හැඳුනුම්පත් අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

05. ස්ථිර ලිපිනය :

5.1 ඉංග්‍රීසි කැපිටල් අකුරින් :.........................................................................................................................
5.2 සිංහලෙන් / දෙමළෙන් : ........................................................................................................................
5.3 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
5.4 පදිංචි දිස්ත්‍රික්කය : ..................................................................................................................
5.5 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය : ......................................................................................................

06. ස්ත්‍රී / පුරුෂ භාවය
පුරුෂ - 0
ස්ත්‍රී - 1

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

07. දුරකථන අංකය:

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

8.0 8.1. උපන් දිනය :

| වර්ෂය | මාසය | දිනය |
|---|---|---|
| | | |

8.2 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනට වයස (2026.09.04)

| අවුරුදු | මාස | දින |
|---|---|---|
| | | |

8.3 විවාහක / අවිවාහකබව

අවිවාහක - 1
විවාහක - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

9.0 අධ්‍යාපන සුදුසුකම් (භාෂා මාධ්‍ය සමග)
**පළමු වර**

(අ) අ.පො.ස.(සා/පෙළ) විභාගය :
I. වර්ෂය හා මාසය : .........................
II. විභාග අංකය : ........................
III. භාෂා මාධ්‍යය : ........................

IV. ප්‍රතිඵල

| | විෂයයන් | සාමර්ථ්‍යය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

(ආ) අ.පො.ස.(උ/පෙළ) විභාගය

I. වර්ෂය හා මාසය : .............................................

II. විභාග අංකය : .............................................

III. භාෂා මාධ්‍යය : .............................................

IV. විභාග ප්‍රතිඵල : .............................................

| | විෂයයන් | සාමාර්ථ්‍යය |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

10. වෘත්තිය සුදුසුකම් :

| NVQ 6 / ඩිප්ලෝමාව | ඩිප්ලෝමාව/ NVQ 6 නිකුත් කළ ආයතනයේ නම | සමත් වූ වර්ෂය | මාධ්‍යය | විභාග අංකය | ඩිප්ලෝමාව / NVQ 6 වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

11. **අයදුම්කරුගේ සහතිකය -**

මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වුත් නිවැරදි වුත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි ඒවා බව මා තෝරාගැනීමට පෙර දැන ගත හොත් මා නුසුදුස්සකු වීමට යටත්වන බවත්, පත්කිරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් මට කිසිදු වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකිරීමට යටත් වන බවත් මම දැන සිටිමි. තවද විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි. එසේම මා විසින් ඉල්ලුම් කරන තනතුර සඳහා එක් ඉල්ලුම් පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන බවට ද සහතික වෙමි.

................................ ............................................,

දිනය අයදුම්කරුගේ අත්සන.

**12.** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................... යන අය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද ඔහු / ඇය මා ඉදිරිපිට දී ................................ දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද සහතික කරමි.

දිනය....................................

........................................,
අත්සන සහතික කරන ලද නිලධාරියාගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

***සටහන :***

දැනටමත් රජයේ තනතුරක් දරන අයදුම්කරුවෙකු විභාගයට ඉල්ලුම් කරන විට තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියෙකු ලවාද,එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු,කොට්ඨාසයේ ග්‍රාම නිලධාරියෙකු ,සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු,ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතු යි.

**13.** දැනටමත් රාජ්‍ය සේවයේ /පළාත් රාජ්‍ය සේවයේ නියුක්තවූවන් සඳහා ( අනවශ්‍ය වචන කපා හරින්න)

ඉහත විස්තර දැක්වෙන අයදුම්කරුට/අයදුම්කාරියට මෙම විභාගය සඳහා පෙනී සිටීමට *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති/නැති බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරෙන් මුදා හැරීමට හැකි/නොහැකි බවත් සහතික කරමි.

.................................
දිනය

........................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම:
තනතුර :
ලිපිනය :
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

08 - 14

---

**රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

## ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025

අංක 2462 දරන 2025 නොවැම්බර් මස 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද “ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025” විභාග නිවේදනයේ, **7.0 සුදුසුකම් ඡේදයේ (ඇ) කොටස** පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

7.0 සුදුසුකම් :

(*ඇ*) 2025.12.08 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. (ඒ අනුව 2007.12.08 දිනට හෝ ඊට පෙර හා 1990.12.08 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

02. ඉහත සංශෝධනය මෙම විභාග අවස්ථාවට පමණක් අදාළ වන බව සැලකිය යුතු ය. එසේම අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.12.08 දින වන විට සම්පූර්ණ කර තිබිය යුතු ය.

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින්ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් කර ගැනීමේ අවසාන දිනය 2026.08.28 තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන්ට මෙම සංශෝධනය හේතුවෙන් නැවත අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූලි මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 19

---

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

බන්ධනාගාර දෙපාර්තමේන්තුව

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2026**

ශ්‍රී ලංකා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වී පවතින කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 3 සේවා ගණයේ III ශ්‍රේණියේ උපවැඩ පරීක්ෂක තනතුරෙහි පවතින පුරප්පාඩු පහක් (05) සඳහා බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් නොවැම්බර් මස කොළඹදී පමණක් පවත්වනු ලැබේ.

1. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය :

(i.) විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂා කර පුරප්පාඩුවලට බඳවා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් වන අතර, එහිදී සුදුසුකම් පරීක්ෂා කිරීම පමණක් සිදු කෙරේ.

(ii.) ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර දෙක (02) කින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. විභාග විෂයයන් සහ ඒ ඒ විෂයයට වෙන් කරන ලද ලකුණු හා කාලය පහත දැක්වේ.

| *අනු. අංකය* | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 02 | තාක්ෂණික දැනුම | පැය 03 | 100 | 40% |

**බුද්ධි පරීක්ෂණය** : මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

**තාක්ෂණික දැනුම** : ගොඩනැගිලි ඉදිකිරීම් මූලධර්ම, ඉදිකිරීම කාර්ය සඳහා පිඹුරුපත් සැකසීමේ හැකියාව වටහා ගැනීම, ජල සැපයීම, ජල ප්‍රවාහන ක්‍රියා මාර්ග හා අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිවෙළ පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

2. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපට දායක මුදල් ගෙවිය යුතු ය.
II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුන(03)ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන(03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.
III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 18/2020 ප්‍රකාරව රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද බන්ධනාගාර දෙපාර්තමේන්තු නිත්‍ය නියෝග හා අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. **වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 10/2025 දරන වැටුප් චක්‍රලේඛයට අනුව MT 1 - 2025 වැටුප් කේත අංකය යටතේ රු. 50,090-10x540-11x630-10x1,010-10x1,190- රු. 84,420/- ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි

වේ. (2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2025 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

4. **සුදුසුකම් :**

4.1 **අධ්‍යාපන සුදුසුකම් :**
සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එක් වරකදී විෂයයන් හය(06)කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

**4.2 කායික සුදුසුකම්:**

I. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
II. තනතුරේ රාජකාරිය ඉටු කිරීමටත් යෝග්‍ය ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුක්ත විය යුතුය.

**4.3 වෘත්තීය සුදුසුකම්:**

අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමේ හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**4.4 වෙනත් සුදුසුකම් :**

I. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.
II. මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතු අතර, යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.
III. චරිත දූෂණයකට අදාළ වරදක් සම්බන්ධයෙන් ඕනෑම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබීම ඉහත තනතුරට පත්වීම සඳහා සම්පූර්ණ නුසුදුසුකමක් වන්නේ ය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දින වන 2026.09.04 දිනට සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

5. **වයස් සීමාව :**

අවම වයස අවුරුදු 18ත්, උපරිම වයස අවුරුදු 35ත් අතර වේ. ඒ අනුව වයස සම්බන්ධ සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 2008.09.04 දින හෝ ඊට පෙර හා 1991.09.04 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

6. **ඉල්ලුම් කිරීමේ පිළිවෙල :**

6.1 විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් ;
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්;
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම;
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්.

*සටහන:-*

(*අ*) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් (E-Mail) හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවනු ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

6.2 අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 10 වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 04 වැනි දින ප.ව. 09.00 ට අවසන් වේ.**

6.3 දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

6.4 අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

6.5 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් ( E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.6 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමුකර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ මුද්‍රිත පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

6.7 විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

07. **විභාගයට ඇතුළු වීම :-**

(*අ*) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාග ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාර දිය යුතුය. ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභාගයට ඉදිරිපත් වීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළයුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට / ඇයට සිදු වනු ඇත.

(*ආ*) අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

08. **අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :-**

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

09. **සාවද්‍ය තොරතුරු සැපයීම සඳහා දඬුවම් :**

අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළි වුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය ගේ පත්වීම අහෝසි කිරීමට කටයුතු කෙරේ.

10. **ප්‍රතිඵල නිකුත් කිරීම :**

පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනය දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මගින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

***සැලකිය යුතු යි*** .- විභාගයට පෙනී සිටීම හෝ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

❖ කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

❖ මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

❖ මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් පවතී නම්, සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කළ යුතු ය.

**ආර්. ප්‍රසාද් හේමන්ත කුමාර,**
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රා/ආ).

2026 ජූලි මස 30 වන දා,
බන්ධනාගාර මූලස්ථානය,
අංක 150,
බේස්ලයින් පාර,
කොළඹ 09.

08 - 39

---

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

**මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025**

**Open Competitive Examination for the Recruitment to the Trainee Grade of the Posts of Inspectors of Measurement Services and Devices of the Sri Lanka Technological Service of Department of Measurement Units, Standards and Services -2025**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන පන්තියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරු සඳහා බඳවා ගැනීමට 2026 නොවැම්බර් මාසයේ දී පැවැත්වීමට නියමිත විවෘත තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

❖ අයදුම්පත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 10 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර, 2026 සැප්තැම්බර් මස 04 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

❖ දැනට රාජ්‍ය / පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ

දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

❖ අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

**01. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
ii. පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.
iii. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාලය තුළ දී ලබාගත යුතු ය.

**02. වැටුප් හා දීමනා :**

- පුහුණු කිරීමේ ශ්‍රේණිය

1 වන වසර - රු. 43,274.00 ක මාසික දීමනාවක්
2 වන වසර - රු. 45,770.00 ක මාසික දීමනාවක්

- තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය
මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 යටතේ MN 3 – 2025
රු. 52,250 -10x 800 – 11 x 1,190 - 10 x 1320 - 10 x 1350 – 100,040/- වන අතර මෙම චක්‍රලේඛයේ උපලේඛන II විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

තනතුරෙහි III වන පන්තියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම ද II වන පන්තියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉම ද I වන පන්තියට පත්වී වසර 05 ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉම ද සමත් විය යුතු ය.

**03. අධ්‍යාපනික සුදුසුකම් :**

සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් අතුරින් භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය, හෝ උසස් ගණිතය සහිතව විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත් වීම;

*හෝ*

පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් එකක් ඇතුළත්ව විෂයයන් තුනකින් එකවර සමත් වීම;

*සහ*

භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

**04. වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම
ii. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 - 30 ත් අතර විය යුතුය. (ඒ අනුව 2008.09.04 දින හෝ ඊට පෙර හා 1996.09.04 දින හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නැත.)
iii. විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි අයකු විය යුතු ය.

**05. බඳවා ගැනීමේ ක්‍රමය :**

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන විවෘත තරග විභාගයකින් සමත් විය යුතු ය.

වසර දෙකක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් පිරිනමන නිපුණතා සහතිකය ලැබීමට සුදුසුකම් ලබන අතර බඳවා ගැනීමේ පන්තිය වන III වන පන්තියට ඇතුළත් කෙරේ.

විභාගයේ සාමර්ථ්‍යය ලැබීම සඳහා එක් එක් විෂයයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රතිශතයක් ලබාගත යුතු ය. එසේ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙළට අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් දෙගුණයක අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල ලේඛනයක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරිම මුළු ලකුණු ලබාගත්තාවූත් අපේක්ෂකයන් පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් කෙරේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල දන්වා යැවීම හෝ

www.results.exams.gov.lk වෙබ් අඩවියේ පළකිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් මාගේ එකඟතාව ලැබීමෙන් පසුව සිදුකරනු ඇත. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

**06.** මෙම විභාගය පහත සඳහන් නගරවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම නගර තම විභාග මධ්‍යස්ථානය ලෙස තෝරා ගත යුතු ය. විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය පහත සඳහන් වගුවට අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතු ය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 02 |
| ගාල්ල | 03 |
| යාපනය | 04 |
| මඩකලපුව | 05 |
| කුරුණෑගල | 06 |
| අනුරාධපුරය | 07 |
| බදුල්ල | 08 |
| රත්නපුර | 09 |

යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹදී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

**07.** **ලිඛිත විභාගය :**

විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට ඉල්ලුම් කළ මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතුය.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

(i) **බුද්ධි පරීක්ෂණය**

කාලය පැය 01 කි. මුළු ලකුණු 100 කි. අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ii) **තාක්ෂණ ප්‍රශ්න පත්‍රය**

කාලය පැය 2 කි. මුළු ලකුණු 100 කි. භෞතික රාශීන් මැනීම සහ ප්‍රායෝගික භෞතික විද්‍යාව පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. අ.පො.ස. (උ. පෙළ) මට්ටමේ දැනුමක් මේ සඳහා සෑහේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

**08.** **අයදුම් කරන ආකාරය :**

මාර්ගගත (online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**09.** විභාග ගාස්තුව රු. 600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon)
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

**10.** *ගැසට්* නිවේදයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින්/ අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල්වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

**11.** ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. කිසියම් රාජ්‍ය ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා ද එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි, රජයේ පාසලක ප්‍රධානියකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

**12.** අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු වේ.

**13.** විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව සනාථ කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව සනාථ කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන කිසිවකු විභාග ශාලාවට ඇතුළත් කර නොගත යුතු ය. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

**14.** විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ.

**15.** මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව සතුවන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවක් වේ නම්, එවැනි විටෙක සිංහල නිවේදනය බලාත්මක වේ.

එස්.එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ.

2026 ජූලි මස 24 දින,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව,
මාහේනවත්ත,
පිටිපන,
හෝමාගම.

8 - 40

**ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය**

(2025 අංක 18 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.) ව්‍යාපාර සැළසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමා පාඨමාලාව - 2026/2027
(ප්‍රධාන බඳවාගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යාපාර සැළසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳ විධායක ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, උසස්, පෙළ අවසන් කළ ශිෂ්‍යයින්, ව්‍යාපාර අංශයෙන් අධ්‍යාපනයේ නිරත ශිෂ්‍යයින්, රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියා නියුතු පිරිස්, ව්‍යාපාරයක් ඇරඹීමට සිටින හෝ විදේශගතවී සිටින, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් සිටින හෝ ව්‍යාපාර කළමනාකරණය, සැළසුම්කරණය සහ කම්කරු නීතිය පිළිබඳව උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට අයදුම්පත් කැඳවා ඇත.

***සුදුසුකම් :*** අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත් වීම.

*හෝ*

වෘත්තීය සහ අධ්‍යාපනික වශයෙන් සලකා බැලිය හැකි වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**සම්පූර්ණ අර්ස (Total credits) :** 30 කි.

**සාමාසික ගණන :** සාමාසික 02 කි.

**ඩිප්ලෝමාවේ ස්වභාවය :** මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය)

***ඉගැන්වීම් ක්‍රමවේදය :*** LMS පද්ධතිය හරහා ඉගැන්වීම්, පහසු දිනයක් තුළ දී නැරඹිය හැකි පටිගත කරන ලද දේශන සහ නිබන්ධන ලබාදීම සිදුකෙරේ.

**මාධ්‍ය :** සිංහල හෝ ඉංග්‍රීසි

**පාඨමාලා කාලය :** මාස 12 කි

***පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු :*** සම්පූර්ණ ඩිප්ලෝමාව සඳහා අයකිරීම රු. 36,000.00 කි. ඩිප්ලෝමාව සඳහා ලියාපදිංචි වීමේදී රු. 1000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තුව වශයෙන් ගෙවිය යුතු ය. රු. 36,000.00 ක මුදල එකවර හෝ වාරික 10කින් ගෙවා අවසන් කළ හැකිය.

**පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :** අයදුම්කරුවන් විසින්,

1. තම ජාතික හැඳුනුම්පතේ/ ගමන් බලපත්‍රයේ හෝ වෙනත් හඳුනාගත හැකි ඡායාරූපයක්,
2. අ.පො.ස. උසස් පෙළ විභාග ප්‍රතිඵල ලේඛනයේ සහ වෙනත් අධ්‍යාපනික සහතික ඡායාරූප.
3. තම වර්ණවත් පැහැදිළි ඡායාරූපයක්,

+94705337702 (Whats App) අංකයට යොමු කළ යුතුය.

**වැඩි විස්තර සඳහා :** කාර්යාල වේලාවන් වන පෙ.ව. 8.30 සිට ප.ව. 4.30 දක්වා 0813169800 දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ජ්‍යෙෂ්ඨ ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා
උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය.

08 - 54

---

**සංශෝධනය කිරීමයි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2497 දරන 2026.07.10 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට (සංඛ්‍යාලේඛනඥ තනතුරට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026 යන ශීර්ෂයෙන් යුතු අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවූ විභාග නිවේදන සංශෝධනය වීම හේතුවෙන් මුල් අයදුම්පත් කැඳවීමේ *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් සියලු විධිවිධාන එලෙසින් ම බලපැවැත්වෙන පරිදි අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය 2026.08.24 දින තෙක් දීර්ඝ කෙරේ.

2. මෙම විභාගය සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍යාංශය.

08 - 61

**රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025

අංක 2462 දරන 2025 නොවැම්බර් මස 07 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද "ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2025" විභාග නිවේදනයේ, 6.0 සුදුසුකම් ඡේදයේ 6.2 සහ 6.3ට අදාළව පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

6.0 සුදුසුකම් :

6.2 වෘත්තීය සුදුසුකම් :

(*අ*) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු වසර සමත් ව තිබීම;

*හෝ*

(*ආ*) ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල විද්‍යාව පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාවේ පළමු වසර සමත් ව තිබීම;

*හෝ*

(*ඇ*) පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉහත 6.2 (අ) හෝ (ආ) සුදුසුකම්වලට සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම.
(එවැනි සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාලවල බලධාරීන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ අවස්ථානුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.)

6.3 පළපුරුද්ද :

(*අ*) (i) රජයේ සේවයේ (පළාත් රාජ්‍ය සේවාවල නොවන) දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයේ පුස්තකාල සහායක / පුස්තකාල සේවක තනතුරක;

*හෝ*

(ii) රජයේ සේවයේ (පළාත් රාජ්‍ය සේවාවල නොවන) සක්‍රියව හා අඛණ්ඩව පුස්තකාල හා සම්බන්ධ රාජකාරි කටයුතුවල නියැලෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් විධිමත් ව තහවුරු කරනු ලබන තනතුරක,

(මෙම තහවුරු කිරීමේ දී එය විධිමත් ලේඛන භාවිතා කරමින් සිදු කළ යුතු වන අතර, මැතදී ගොනුවට ඇතුළත් කරන ලද සේවා සහතික වැනි දේ මගින් සිදු කරන තහවුරු කිරීම් වලංගු නොවේ.)

ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(*ආ*) ඉහත 6.2 හි (අ), (ආ) සහ (ඇ) හි සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් **එකක් හෝ සම්පූර්ණ කර ඇත්නම්,** එම අපේක්ෂකයන් ඉහත 6.3 (අ) හි (i) හෝ (ii) සඳහන් තනතුරක

ස්ථිරකර කර තිබීම සහ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන නියමිත දිනට එම තනතුරෙහි වසර 05ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

**02. අයදුම්කරුවන් තනතුරට අදාළ සියලු සුදුසුකම් 2025.12.08 දින වනවිට සම්පූර්ණ කර තිබිය යුතු ය.**

03. එම *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බලපැවැත්වෙන අතර මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාර ගැනීමේ **අවසාන දිනය 2026.08.28** තෙක් දීර්ඝ කරනු ලැබේ. මේ වනවිටත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධන හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස දැනුම් දෙනු ලැබේ.

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූලි මස 22 වැනි දින,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

08 - 95

## සංශෝධනයයි

වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ පවතින වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු සහකාර සේවයේ III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

2026 ජුනි මස 19 දිනැති අංක 2494 *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත බඳවා ගැනීමේ නිවේදනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

❖ අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Application - Recruitment Exams/ E.B.Exams" ඔස්සේ පළ කර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 ජුනි මස 22 දින පෙ.ව. 9.00 ට විවෘත වන අතර 2026 සැප්තැම්බර් මස 07 වැනි දින ප.ව. 9.00ට අවසන් වේ.**

❖ 6.0 වයස් සීමාව :
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 34ට නොවැඩි විය යුතු ය.

තවද 2026.07.20 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සහ කොන්දේසි සෑම ආකාරයකින්ම සම්පූර්ණකර තිබිය යුතු ය.

ඉහත කරුණු හැර 2026 ජුනි මස 19 දිනැති අංක 2494 *ගැසට් පත්‍රයේ* පළ කරන ලද අනෙකුත් කරුණු තවදුරටත් නොවෙනස්ව පවතී.

ආචාර්ය (ඉංජි). **කිත්සිරි වැලිගෙපොලගේ,**
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

08 - 98

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
## (විවෘත පදනම මත බඳවා ගැනීම)

**(i) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්), III ශ්‍රේණිය**

**(ii) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි ), III ශ්‍රේණිය**

**(iii) ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී-පුහුණු කිරීමේ ශ්‍රේණිය**

**01.** ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන්, ගොඩනැගිලි අධ්‍යක්‍ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රාජකාරි කටයුතු සිදුකරන වැඩබිම් දිවයින පුරා විසිරී ඇති අතර, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණියේ පුරප්පාඩු 13 සඳහාත්, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණියේ පුරප්පාඩු 02 සඳහාත් සහ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ සැලසුම් ශිල්පී- පුහුණු කිරීමේ ශ්‍රේණියේ පුරප්පාඩු 07 සඳහාත් සුදුසුකම් ලත් අයදුම්කරුවන් විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

***සටහන:1*** ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්/විදුලි) III ශ්‍රේණියට සුදුසුකම් ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට ප්‍රමාණවත් නොවන විට, ඉතිරි පුරප්පාඩු සඳහා පුහුණු ශ්‍රේණියට අදාළ සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලැබේ.

***සටහන:2*** සීමිත පදනම මත බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කිරීමට සුදුසුකම් සැපුරූ අයදුම්කරුවන් නොමැති නම් එම පුරප්පාඩු ප්‍රමාණය ද විවෘත පදනම මත බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**02.** මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් **2026.09.04** වැනි දින හෝ එදිනට ප්‍රථම **"ගොඩනැගිලි අධ්‍යක්‍ෂ ජනරාල්, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, 2 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල"**යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්/ විදුලි/ සැලසුම් ශිල්පී-පුහුණු) තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය"**යනුවෙන් අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කළ යුතු ය. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතික වල පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

- ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි, අසම්පූර්ණ හා නියමිත සුදුසුකම් සම්පූර්ණ නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. එවැනි අයදුම්කරුවන්ට බඳවා ගැනීමේ තරඟ විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු නොලැබේ.
- එසේම අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:**

3.1 මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය.

3.2 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද රජයේ මුදල් රෙගුලාසිවලටද රජයේ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ හා උපදෙස්වලටද ඊට අදාළව වරින්වර නිකුත් කරනු ලබන සංශෝධනවලට සහ දෙපාර්තමේන්තු නියෝගවලට ද ඔබ යටත් විය යුතු වේ.

**04. සාමාන්‍ය සුදුසුකම්:**

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතු ය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.

4.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට එකඟ විය යුතු ය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු සහ 30ට නොවැඩි විය යුතු ය.

**05. අධ්‍යාපන සුදුසුකම්:**

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

5.2 විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අ.පො.ස.(උ.පෙළ) විභාගය එකවර සමත්වීම.

**06. වෘත්තීය සුදුසුකම්:**

**6.1 කාර්මික නිලධාරි (සිවිල්/විදුලි), III ශ්‍රේණිය**

ඉහත 05. හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

I. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව,

*හෝ*

II. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව,

*හෝ*

III. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව,

*හෝ*

IV. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව,

*හෝ*

V. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම,

*හෝ*

VI. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

VII. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**6.2 සැලසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)**

ඉහත 05. හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම;

*හෝ*

II. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳව එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

III. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයින් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම;

*හෝ*

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන :*
ඉහත 05. හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.2 හි සඳහන් සැලසුම් ශිල්පී - පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා (එක් වසරක) නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

7.1 ලිඛිත තරඟ විභාගයේ කොන්දේසි:

මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් බලය පවරනු ලබන ආයතනයක් මඟින් කොළඹ දී පවත්වනු ලබනු අතර, ඒ අනුව අදාළ ආයතනය දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඒ අනුව පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.
(අයදුම්පත්‍රයේ ඔබ විසින් සම්පූර්ණ කර ඇති තොරතුරු සත්‍ය බව සලකා, ඒ අනුව සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් පමණක් විභාගයට කැඳවනු ලැබේ.)

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරඟ විභාගයකට යොමුකරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.
එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

7.3 ලිඛිත තරග විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ.

7.3.1 **කාර්මික නිලධාරි (සිවිල්/විදුලි) සඳහා**

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 2 | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 2 1/2 | 100 | 40 |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කාණුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | **කාර්මික නිලධාරි (සිවිල්) තනතුර**<br><br>මාන, සැළසුම් පිළිබඳ දැනුම, අත්තිවාරම්, පස් වර්ග, ගොඩනැගිලි ද්‍රව්‍ය, ගොඩනැගිලි ව්‍යුහය සහ නිමාව, ගොඩනැගිලි සැළසුම් මගින් ප්‍රමාණ ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ජල සැපයුම් හා පල්දෝරු ක්‍රම. |
| | **කාර්මික නිලධාරි (විදුලි) තනතුර**<br><br>ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ පිළිබඳ දැනුම, අනුගමනය කළ යුතු රෙගුලාසි, සැලසුම් පිළිබඳ දැනුම, ඇස්තමේන්තු සැකසීම හා පරිපථවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම |

7.3.2 **සැලසුම් ශිල්පී තනතුර- පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා**

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01.බුද්ධි පරීක්ෂණය | පැය 1 | 100 | 40 |
| 02.විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 | 100 | 40 |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| *01. බුද්ධි පරීක්ෂණය* | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කාණුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| *02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය* | සුදුසු පරිමාණයකට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙල කිරීමේ හැකියාව |

7.4 ලිඛිත තරග විභාගය **සිංහල /දෙමළ භාෂාවෙන්** පමණක් පවත්වනු ලැබේ.

**08.** **බඳවා ගැනීම:**

ඉහත 05. සහ 06. යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් ඉහත 07. අනුව පුරප්පාඩු ප්‍රමාණය මත ඉහළම ලකුණු ලබා ගන්නා සුදුසුකම් ලත් අයදුම්කරුවන් අතරින් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය, කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණිය හා සැලසුම් ශිල්පී පුහුණු කිරීමේ ශ්‍රේණිය සඳහා බඳවා ගනු ලැබේ.

**09.** **වැටුප් පරිමාණය:**

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි MN-3-2025 යටතේ

කාර්මික නිලධාරි (සිවිල්/විදුලි), III ශ්‍රේණිය
රු.52,250/-10x 800 –11 x1190–10x1320–10 x1350–රු. 100,040/-
(වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි උපලේඛන II අනුවය)

සැලසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)
මාසික දීමනාව රු.43,274/-
(වැටුප් ගෙවනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 හි උපලේඛන VI අනුවය)

**10. විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු.1,500 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු.1,500ක විභාග ගාස්තුවක් දිවයිනේ පිහිටි ඕනෑම ලංකා බැංකුවක් මගින් **"ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ බත්තරමුල්ල, ලංකා බැංකු අංක 7042710 දරන ගිණුම"**වෙත ගෙවිය යුතු අතර, ලදුපතේ මුල් පිටපත අයදුම්පතේ අංක 12 යටතේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය.

**11.** යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

**12. අත්සන සහතික කිරීම :**

අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/ විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරයක විහාරාධිපති, නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතු ය.

මෙම නිවේදනයෙන් ආවරණය නොවන කරුණක් සඳහා අවසන් තීරණ ගැනීමේ බලය ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් සතු වේ. එසේම සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි පරිවර්තනයන් අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය නිවේදනය බලපැවැත්වේ.

**ඉංජි.ඩබ්.ආර්.එන්.ආර්.ප්‍රේමචන්ද්‍ර,**
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්,

2026 ජූලි මස 30 වැනි දින,
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

08 - 63

**ආදර්ශ අයදුම්පත්‍රය** (විවෘත පදනම මත)

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.

**අයදුම්කරන තනතුර :**
**(අදාල කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න.)**

**(i) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්), III ශ්‍රේණිය**
**(ii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (විදුලි), III ශ්‍රේණිය**
**(iii) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)**

**භාෂා මාධ්‍යය**

**සිංහල -**
**දෙමළ -** **(අදාල කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න)**

01. (i) සම්පූර්ණ නම : ..........................................................................................................................

..........................................................................................................................

(ii) මුලකුරු සමග නම : ..........................................................................................................................

(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) : ..............................................................................
..........................................................................................................................................

02. ලිපිනය හා දුරකථන අංක :

(i) කාර්යාලීය ලිපිනය : ..........................................................................................................................
..........................................................................................................................................
දුරකථන අංකය : ..........................................................................................................................

(ii) පෞද්ගලික ලිපිනය : ..........................................................................................................................
..........................................................................................................................................

(iii) දුරකථන අංකය : .............................. (iv) ජංගම දුරකථන අංකය ; .....................................

03. ස්ත්‍රී/පුරුෂ භාවය :

පුරුෂ -

ස්ත්‍රී -

**(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න)**

04. ජාතික හැඳුනුම්පත් අංකය :

05. (i) උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

06. විවාහක/අවිවාහක බව :

විවාහක

අවිවාහක

**(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදා සලකුණු කරන්න)**

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) **(කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න.)**

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය : ..........................................................................................

(ii) විභාග අංකය : ..........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| .................................................. | .............. | .................................................. | .............. |
| .................................................. | .............. | .................................................. | .............. |
| .................................................. | .............. | .................................................. | .............. |
| .................................................. | .............. | .................................................. | .............. |
| .................................................. | .............. | .................................................. | .............. |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍ය නම් පමණක් (**කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න.**) :

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය : ........................................................................................

(ii) විභාග අංකය : ........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................................ | ............... | ........................................................ | ............... |
| ........................................................ | ............... | ........................................................ | ............... |
| ........................................................ | ............... | ........................................................ | ............... |
| ........................................................ | ............... | ........................................................ | ............... |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (**කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න.**):

විභාගය සමත් වූ වර්ෂය : ........................... මාසය : ................................ දිනය : ..................

විභාග අංකය : ........................................................................................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| ........................................................ | ............... | ........................................................ | ............... |
| ........................................................ | ............... | ........................................................ | ............... |
| ........................................................ | ............... | ........................................................ | ............... |

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (**කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න.**)

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද (**කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න.**):

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්ය බව සලකන්න.

12. විභාග ගාස්තු :

| |
|---|
| රු.1,500ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. (**රිසිට්පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.**) |

13. අයදුම්කරුගේ සහතිකය:

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තවද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

දිනය : ......................................

..................................................................,
**අයදුම්කරුගේ අත්සන.**

14. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරීම :

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................ (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

දිනය: ..........................

.......................................................................,
**සහතික කරන නිලධාරියාගේ අත්සන.**

සහතික කරන නිලධාරියාගේ නම :
තනතුර :
ලිපිනය :
නිල මුද්‍රාව :

**15. රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි**

මෙම ඉල්ලුම්කරු වන .....................................................................මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ........................................................................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.........................................................,
**ආයතන ප්‍රධානියාගේ අත්සන.**

නම :
තනතුර :
ලිපිනය :
නිල මුද්‍රාව :

08 - 63

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

### ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (පළමු වාරය)

2014.10.11 වැනි දින හා අංක 1883/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 08 වැනි වගන්තියේ සඳහන් පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් II ශ්‍රේණියට උසස් කිරීමට පෙර සහ II ශ්‍රේණියට බඳවා ගනු ලබන සියලුම දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් පත්වීම් දින සිට තෙවසරක කාලයක් ඇතුළත සමත් විය යුතු වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය, 2026/09/06 වන දින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**04** ***සුදුසුකම් :***

අදාළ විභාගය සම්පූර්ණ කර නොමැති, ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන්ට සහ පත්වීම ස්ථිර නොකරන ලද දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන්ට මෙම විභාගයට අයදුම් කළ හැක. තව ද පූර්වයෙහි මෙම දෙපාර්තමේන්තු විභාගය සම්පූර්ණ නොකරන ලද වෛද්‍ය නිලධාරීන්, පරිපාලන ශ්‍රේණියේ හෝ විශේෂඥ වෛද්‍ය ශ්‍රේණියේ තනතුරකට පත්කර ඇත්නම් එම නිලධාරීන්ට ද මෙම විභාගය සඳහා අයදුම් කළ හැකිය.

**05** ***අයදුම්කිරීම :***

පහතින් දක්වා ඇති QR කේතය භාවිත කර හෝ https://forms.gle/cKmkCAc61dRQJX5X6 සබැඳිය මගින් මාර්ගගත (Online) ක්‍රමයට ගූගල් පෝරමය (Google form) සම්පූර්ණ කොට උඩුගත (Upload) කර, ඊට අමතරව මෙම චක්‍රලේඛ ලිපියේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ද සම්පූර්ණ කර ආයතන ප්‍රධානි මගින් අධ්‍යක්ෂ (විභාග), සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08 යන ලිපිනයට 2026/08/14 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි "ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (පළමු වාරය)" ලෙස සඳහන් කළ යුතු ය. මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට පෙනී සිටීමට අයදුම්කරු විසින් අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පෞද්ගලික ලිපි ගොනු විෂය භාර නිලධාරියා විසින් ද, සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු සියල්ල නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් ද, සහතික කර තිබීම අනිවාර්යය වේ.

*වැදගත් :-*

***මාර්ගගත (Online) ක්‍රමයට ගූගල් පෝරමය (Google form) සම්පූර්ණ කර 2026/08/14 දිනට උඩුගත (upload) නොකරන අයදුම්කරුවන්ගේ අයදුම්පත් ද 2026/08/14 දිනට පසු ප්‍රමාද වී ලැබෙන මුද්‍රිත අයදුම්පත් ද අසම්පූර්ණ හෝ නිවැරදි නොවන අයදුම්පත් ද කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.***

***සැලකිය යුතු යි :-*** විභාග අයදුම්පත, ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුව A4 කඩදාසියක දෙපැත්ත භාවිත කරමින් පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 09 දක්වාත් සකස් කර ගත යුතු ය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියලුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**06** *විභාග ගාස්තු :*

I විභාගයට පළමුවන වතාවට ඉදිරිපත්වන අයදුම්කරුවන් විභාග ගාස්තුවලින් නිදහස් කරනු ලැබේ. මීට පෙර අයදුම් කළ ද විභාගයට පෙනී නොසිටි අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/- බැගින් අවලංගු නොකළ මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා ඒවා නිසි ලෙස අවලංගු කළ යුතු ය.

II කිසිදු කරුණක් මත ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

**07** *විභාගයට ඇතුළත් කර ගැනීම.*

I මාර්ගගත (Online) ක්‍රමයට ගූගල් පෝරමය (Google form) සම්පූර්ණ කර හා උඩුගත (Upload) කර මෙම චක්‍රලේඛ ලිපියේ අවසානයේ ඇති ආදර්ශ අයදුම්පත්‍රය ද නිසි පරිදි සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින්ට පමණක් මෙම චක්‍රලේඛයේ 09 ඡේදයේ සඳහන් ආකාරයට ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ලැබේ.

II එම ප්‍රවේශපත් ආයතනයේ මාණ්ඩලික නිලධාරියෙකු වෙතින් සහතික කර නියමිත පරිදි සම්පූර්ණ කර, විභාගයේ පළමු දිනයේ දී විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

III විභාග අපේක්ෂක /අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුළදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාව තහවුරු කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

(*අ*) ජාතික හැඳුනුම්පත;
(*ආ*) සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හෝ ඊට අදාළ ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද රාජකාරි හැඳුනුම්පත;
(*ඇ*) වලංගු රියදුරු බලපත්‍රය;
(*ඈ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**08** *විභාග පරිපාටිය :*

මෙම විභාගය ලිඛිත, රචනා ප්‍රශ්න පත්‍ර තුනක් සහ සිංහල/දෙමළ වාචික පරීක්ෂණයක් වශයෙන් කොටස් හතරකින් සමන්විත ය. එක් එක් කොටසක් සඳහා ලකුණු 100ක් බැගින් වෙන් කෙරේ. සමත්වීම සඳහා එක් කොටසකට අවම වශයෙන් ලකුණු 50 ක් ලබාගත යුතු ය. එක් වරක දී හෝ කිහිපවරක දී කොටස් වශයෙන් පෙනී සිට විභාගය සම්පූර්ණ කළ හැකිය. නිලධාරීන් විභාගයට පෙනී සිටින පළමු අවස්ථාවේ දී අදාළ සියලුම විෂයයන් සඳහා පෙනී සිටීම අනිවාර්ය වේ.

**09** *විෂය නිර්දේශය :*

07.1 ලිඛිත විභාගය

07.1.1 ආයතන සංග්‍රහය ප්‍රශ්න පත්‍රය
කාලය පැය 02 යි. ප්‍රශ්න 08 කින් ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතු ය.
*විෂය නිර්දේශය :*
i. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ පොදු රෙගුලාසි;
ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ රීති හා රෙගුලාසි;
iii. ආයතන සංග්‍රහය.

I කොටස - VI, VII, VIII, IX, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII, XXIII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXI, XXXII යන පරිච්ඡේදයන්
II කොටස - XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්

07.1.2 රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ප්‍රශ්න පත්‍රය
කාලය පැය 1½යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.
*විෂය නිර්දේශය :*
සෞඛ්‍ය සේවා සංග්‍රහය

i. රෝහල් හා මහජන සෞඛ්‍ය පරිපාලනය
ii. රසායනාගාර සේවා කළමනාකරණය
iii. ඖෂධ කළමනාකරණය

07.1.3 ගිණුම් ප්‍රශ්න පත්‍රය

කාලය පැය 02 යි. ප්‍රශ්න 07 කින් ප්‍රශ්න 04 කට පිළිතුරු සැපයිය යුතු ය.
*විෂය නිර්දේශය:*

i. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තොග කළමනාකරණය හා ගිණුම්කරණ රෙගුලාසි
ii. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලැබූ කළමනාකරණ අත් පොතෙහි මූල්‍ය කොටස
iii. වෛද්‍ය නිලධාරීන් සඳහා දෛනික පරිපාලන රාජකාරි සඳහා අදාළවන රාජ්‍ය මූල්‍ය රෙගුලාසි

| | | |
|---|---|---|
| පරිච්ඡේද I | - | මූ.රෙ 1, 2, 78 |
| පරිච්ඡේද II | - | මූ.රෙ 90, 91, 101, 102, 103, 104, 105, 106, 107, 108, 109, 110, 113, 115, 118, 119 |
| පරිච්ඡේද III | - | මූ.රෙ 124, 125, 126, 127, 128, 131, 133, 134, 135, 136, 137, 138, 139, 140, 142, 143, 151, 152, 154, 155, 156, 189 |
| පරිච්ඡේද V | - | මූ.රෙ 200,201, 215, 225, 238, 245, 255, 257, 260 |
| පරිච්ඡේද VI | - | මූ.රෙ 380, 381, 382, 383, 384, 385, 386, 388, 389, 390, 391, 392, 393, 394 |
| පරිච්ඡේද VII | - | මූ.රෙ 488, 493 |
| පරිච්ඡේද XIII | - | මූ.රෙ 715,716, 756, 757, 758 |

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

| | |
|---|---|
| 1 වැනි පරිච්ඡේදය - | සියලුම වගන්ති |
| 2 වැනි පරිච්ඡේදය - | 2.3, 2.4, 2.5, 2.6, 2.7, 2.8 |
| 3 වැනි පරිච්ඡේදය - | 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 3.7, 3.8, 3.9 |

07.2 සිංහල/ දෙමළ වාචික පරීක්ෂණය :

සිංහල/ දෙමළ භාෂා ප්‍රවීනතාව මැනීම සඳහා දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින් විසින් පවත්වනු ලබන වාචික පරීක්ෂණයකි. තමන්ගේ සාමාන්‍ය රාජකාරි කටයුතු කරගෙන යාමේ දී පැන නගින කරුණු සම්බන්ධයෙන් සිංහල මාධ්‍ය නිලධාරින්ට දෙමළ මාධ්‍යයෙන් ද, දෙමළ මාධ්‍ය නිලධාරින්ට සිංහල මාධ්‍යයෙන් ද චතුර ලෙස අදහස් හුවමාරු කර ගැනීමට ඇති හැකියාව පරීක්ෂා කරනු ලැබේ. කාලය විනාඩි 10 කි.

08. *විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම :*

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ බලාගෙන උත්තර ලිවීම තහනම් ය. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය දෙස බැලීම ද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන් ද වැළකී සිටිය යුතු ය. තව ද ජංගම දුරකතන, ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද ගණක යන්ත්‍ර ද (Calculator) භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු ය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**09.** *විභාග ප්‍රවේශපත්‍ර :*

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ නාමලේඛනය සෞඛ්‍ය අමාත්‍යාංශ නිල වෙබ් අඩවියට යොමු කළ දින සිට අයදුම්කරුවන්ට තම ප්‍රවේශපත්‍ර බාගත (download) කර ගත හැකිය. මෙම ප්‍රවේශපත්‍ර PDF ආකෘතියෙන් ඇතුළත් කර ඇති අතර, තම ජාතික හැඳුනුම්පත් අංකය යොදා සෙවීම් (Search) කර ප්‍රවේශපත්‍රය බාගත (Download) කර ගැනීමෙන් පසු මුද්‍රණය කර ගත යුතු වන අතර, මුද්‍රිත ප්‍රවේශපත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා මගින් සහතික කරගෙන අදාළ විභාග මධ්‍යස්ථානය වෙත රැගෙන ඒමට කටයුතු කළ යුතු වේ.
Web Path :- www.health.gov.lk → More → Resources → Examination → Exam Notice

10. කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දැ ඔබ රෝහලේ/ ආයතනයේ සේවයේ නියුතු සියලුම අදාළ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු www.health.gov.lk වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය.
Web Path :- www.health.gov.lk → More → Resources → Examination → Circulars → Medical Officer/Dental Surgeon

***සැ.යු. :- මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.***

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජූලි මස 30 වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
“සුවසිරිපාය”,
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

*කාර්යාලීය ප්‍රයෝජනය සඳහා*

***EXL***

**ආදර්ශ අයදුම්පත**

ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරින් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරින් සඳහා වන
කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (පළමු වාරය)

**01.** (අ)(i) අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) : ……………………………………………………………
……………………………………………………………………………………

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | |

(iii) මුලකුරු සමග නම (සිංහලෙන්) : ……………………………………………………………………
……………………………………………………………………………………………………

(iv) මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

| | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | | | | |

***වැදගත් :-***

***මෙහි දක්වා ඇති QR කේතය භාවිතා කර හෝ***
**https://forms.gle/cKmkCAc61dRQJX5X6** **සබැඳිය මගින්**
මාර්ගගත ක්‍රමය (Online) මගින් ගූගල් පෝරමය (Google form)
සම්පූර්ණ කර උඩුගත කරන්න.

මාර්ගගතව (online) උඩුගත කළ (upload) දිනය :- .......................

(ආ) (i) නිල නාමය (අදාළ කොටුව තුළ (√) ලකුණ යොදන්න)

වෛද්‍ය නිලධාරී : ☐ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරී : ☐

(ii) සීමාවාසික පත්වීම ලද දිනය: ……………………………………………………………………

(iii) ප්‍රාථමික ශ්‍රේණියට/II ශ්‍රේණියට පත්වීම ලද දිනය: ………………………………………………

(iv) ජංගම දුරකතන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(v) ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

(vi) විද්‍යුත් තැපැල් ලිපිනය : ……………………………………………………………………

**02.** ඔබ මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු විෂයයන් ඉදිරියේ ඇති කොටුව තුළ (√) ලකුණ යොදන්න. පෙනී නොසිටින්නේ නම් (×) ලකුණ යොදන්න.

රෝහල් සහ බෙහෙත් ශාලා පරිපාලනය ☐ ආයතන සංග්‍රහය ☐ ගිණුම් ☐

සිංහල වාචික ☐ දෙමළ වාචික ☐

**03.** විභාගයට පෙනී සිටින මාධ්‍යය (අදාළ කොටුව තුළ (√) ලකුණ යොදන්න)

සිංහල ☐ ඉංග්‍රීසි ☐ දෙමළ ☐

**04.** (අ) දැනට සේවය කරන ආයතනය : (සිංහලෙන්) ……………………………………………………
: (ඉංග්‍රීසියෙන්) ……………………………………………………

(ආ) එය අයත් දිස්ත්‍රික්කය : ……………………………………………………………………………………

(ඇ) මෙම ආයතනය අයත් වන්නේ - රේඛීය අමාත්‍යාංශයට
- පළාත් සභාවට

(ඈ) පළාත් සභාවේ නම් අදාළ පළාත : ……………………………………………………………………………

(ඉ) ඔබ විභාගය සඳහා පෙනී සිටීමට බලාපොරොත්තු වන දිස්ත්‍රික්ක :

01 ……………………………… 02 ……………………………………………… 03 ………………………………………………

(මෙම දිස්ත්‍රික්කයන්හි විභාග මධ්‍යස්ථානයක් නොමැති නම් හෝ පෙනී සිටිය හැකි අයදුම්කරුවන් ප්‍රමාණය ඉක්මවන විට හෝ ආසන්නතම විභාග මධ්‍යස්ථානයට අනුයුක්ත කරනු ඇත.)

| *මුද්දර කොටුව* |
|---|

**05.** (*අ*) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ……………………………………………………………………

(*ආ*) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වරට නොවේ නම් මුද්දර අලවා තිබේද? ……………………………………

*06. අයදුම්කරුගේ සහතිකය :*

*මගේ දැනුම හා විශ්වාසය පරිදි,*

(I) මෙම අයදුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත්, මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/ ප්‍රථම වතාවට නොවන* බැවින් රු. ......................... ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම් පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මාගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

දිනය .................................... ..............................................................,

අයදුම්කරුගේ අත්සන.

**07.** පෞද්ගලික ලිපිගොනු විෂය භාර නිලධාරියාගේ / නිලධාරිණියගේ* සහතිකය :

මෙම අයදුම්පත, අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට පෙර/ පසු* මා වෙත භාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණ කර ඇති බවත්, මෙම විභාගයට පෙනී සිටීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

දිනය ................................... ……………………………………,

විෂය භාර නිලධාරියාගේ නම සහ අත්සන.

**08.** *ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

.......................................................................... මහතා /මිය /මෙනවිය* වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු* වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බව ද / ප්‍රථම වතාවට නොවන* බව ද රු ............................. ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද/ මුද්දර ඇලවීමට අනවශ්‍ය බව ද, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බව ද, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට සුදුසුකම් ඇති බව ද මා ඉදිරිපිට දී අත්සන් කළ බව ද සහතික කරමි.

දිනය .................................. ...............................................................,

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිලමුද්‍රාව තැබිය යුතුය)

**09.** *විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය :*

........................................... මහතා/ මහත්මිය/ මෙනවිය* වෛද්‍ය නිලධාරියකු/ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධාරියකු* වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ ඇයට* සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය .................................. ..........................................................................................

විමධ්‍යගත කොට්ඨාස / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(නිලමුද්‍රාව තැබිය යුතුය)

(* අනවශ්‍ය කොටස් කපා හරින්න. )

08 - 50

---

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා (සිවිල්) ගණයට අයත් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) සහ ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) සහ ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉල්ලුම්පත්‍රය, මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව A4 කඩදාසියේ (21cm x 29cm) දෙපැත්ත භාවිතා කරමින් සකස්කර, අපේක්ෂකයා විසින් තම අත් අකුරින්ම පිරවිය යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය 2026.09.01 දින හෝ ඊට පෙර ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය, අංක 80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත පාර, බත්තරමුල්ල යන ලිපිනයට, ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරි (III ශ්‍රේණිය)/ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026" ලෙස සඳහන් විය යුතු ය. මෙම විභාගය කොළඹ දී පවත්වනු ඇත.

රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් ස්වකීය ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රමාද වී ලැබෙන හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයා/ අපේක්ෂිකාව තමා විභාගයට පෙනී

සිටීමට අදහස් කරන භාෂා මාධ්‍යයෙන් අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය.

1. රැකියා විස්තරය :

ආයතන අරමුණු ඉටු කිරීමේ කාර්යයන්හි දී විධායක මට්ටම්වල කාර්යය භාරයට උපස්ථම්භක වන සේ, විධායකය විසින් නිශ්චිත කොට පවරනු ලබන පිරිස් පාලනය, මුදල් භාරකත්වය හා මුදල් පරිහරණය, අධීක්ෂණය හා මෙහෙයුම් යන කාර්යයන් ඇතුලත් බහුමාන (Multi Functional) ස්වරූපයේ කාර්යයන් ඉටු කරන සේවා ශ්‍රේණියකි.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

2.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතු වේ. වැන්දඹු/ වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

2.2 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද මුදල් රෙගුලාසිවලටද රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන අංක 2310/29 දරන 2022.12.14 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටික රීතිවලටද කලින් කලට රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද යටත් විය යුතු ය.

**කාර්මික නිලධාරි (III ශ්‍රේණිය) තනතුර: (තනතුරු ගණන 01)**

1. බඳවා ගැනීමේ සුදුසුකම් :

1.1 සාමාන්‍ය සුදුසුකම් ;

1.1.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
1.1.2 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
1.1.3 බඳවා ගන්නා නිලධාරීන් දිවයිනේ කවර ප්‍රදේශයක උවද සේවය කිරීමට කැමති විය යුතු ය.
1.1.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
1.1.5 යම් ආගමක/ ආගමික නිකායක පැවදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
1.1.6 සේවයට බඳවා ගැනීම සඳහාවන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍යවන සුදුසුකම්, අයදුම්පත්‍රය භාර ගනු ලබන අවසාන දිනයට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.

1.2 අධ්‍යාපන සුදුසුකම් :

- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*හා*

- ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාව විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.3 වෘත්තීය සුදුසුකම් :

ඉහත අධ්‍යාපන සුදුසුකම් සහිතව පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් අයදුම්කරුවන් විසින් ලබා ගත යුතු ය.

- මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

- අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව;

*හෝ*

- ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව

*හෝ*

- රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

- උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතන වලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියලු අතින් සමාන යැයි තෘතික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකමක් ලබා තිබීම.

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිපල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 ලිඛිත විභාගය :

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර එකකින් (01) සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. පොදු පරීක්ෂණය (විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය) | පැය 3 | 100 | 40 |

2.3 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | සුදුසු පරිමාණයන්ට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙළ කිරීමේ හැකියාව හා ගොඩනැගිලි සඳහා භාවිතා කරන වායු සමීකරණ යන්ත්‍ර වර්ගීකරණය පිළිබඳව, කාර්යාල උපකරණ වර්ගීකරණය පිළිබඳව දැනුම. |

3. මාසික වැටුප් පරිමාණය හෝ දීමනා අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව කාර්මික නිලධාරි III ශ්‍රේණිය තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 52,250 – 800 x 10 - 1,190 x 11 -1,320 x 10 - 1,350 x10 - රු. 100,040 (MN-3 2025) වේ. මෙයට අමතරව රජයේ නිලධාරින්ට රජය විසින් කළින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද මෙම තනතුර දරන්නාට හිමිවනු ඇත.

**ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) තනතුර: (තනතුරු ගණන 01)**

1. බඳවා ගැනීමේ සුදුසුකම්:

1.1 සාමාන්‍ය සුදුසුකම් ;

1.1.1. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
1.1.2 අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
1.1.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක උවද සේවය කිරීමට කැමති විය යුතු ය.
1.1.4 අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.
1.1.5 යම් ආගමක/ ආගමික නිකායක පැවදිවරයක් දරන කිසිදු තැනැත්තකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
1.1.6 සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍යවන සුදුසුකම්, අයදුම්පත්‍රය භාර ගනු ලබන අවසාන දිනයට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතු ය.

1.2 අධ්‍යාපන සුදුසුකම් :

- සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*හා*

- ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා විෂය ධාරාව විෂයයන්

තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

1.3 වෘත්තීය සුදුසුකම් :

- රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තිය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

2. බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනයකර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 ලිඛිත විභාගය :

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර එකකින් (01) සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. පොදු පරීක්ෂණය (විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය) | පැය 3 | 100 | 40 |

2.3 ලිඛිත විභාගයේ විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | සුදුසු පරිමාණයට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙළ කිරීමේ හැකියාව, ගොඩනැගිලිවල විද්‍යුත් පරිපථ පිළිබඳ දැනුම, ඒ සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු රෙගුලාසි, සැලසුම් පිළිබඳ දැනුම, ඇස්තමේන්තු සැකසීම |

3. මාසික වැටුප් පරිමාණය හෝ දීමනා :

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි උපලේඛන II අනුව කාර්මික නිලධාරී III ශ්‍රේණිය තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 52,250 – 800 x 10 - 1,190 x 11 -1,320 x 10 - 1,350 x10 - රු. 100,040 (MN-3 2025) වේ. මෙයට අමතරව රජයේ නිලධාරින්ට රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාද මෙම තනතුර දරන්නාට හිමිවනු ඇත.

4. කාර්යක්ෂමතා කඩයිම් :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය.

5. භාෂා ප්‍රවීණතාව :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය.

6. ශ්‍රේණි උසස් කිරීම් :

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතු ය.

7. විභාග ගාස්තු :

7.1. විභාග ගාස්තුව රු. 1000/- කි. විභාග ගාස්තු ගෙවීමේදී පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ, ලංකා බැංකුව, බත්තරමුල්ල ශාඛාවේ ගිණුම් අංක 7040472 වෙත බැර කළ යුතු ය. කුවිතාන්සිය අයදුම්පත්‍ර යේ අදාළ ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතු ය. මතු ප්‍රයෝජනය සඳහා කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය.

i. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).
ii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය (Online Banking Method of Bank of Ceylon).
iii. අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank debit Card with the Facility of Internet transaction).

7.2 විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

8. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින විෂයය/ විෂයයන් සඳහා ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ

යුතු ය. ඒ සඳහා, පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු විය යුතු ය.

(i.) ජාතික හැඳුනුම්පත;
(ii.) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
(iii.) වලංගු රියදුරු බලපත්‍ර.

9. සාවද්‍ය තොරතුරු සැපයීම :

ඔබ විසින් එවන ලද අයදුම් පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීමේ අයිතිය ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය සතු වේ.

11. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියා මාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්ත්වයක් ඇති වුවහොත් හෝ ඒ පිළිබඳව ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

12. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය නියමය පරිදි.

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය,

2026 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
අංක 80/5, ගොවිජන මන්දිරය,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

| |
|---|
| |

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)**

**ආදර්ශ අයදුම්පත්‍රය**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ අධීක්ෂණ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයට අයත් කාර්මික නිලධාරී (III ශ්‍රේණිය) සහ ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**

විවෘත තරග විභාගය සඳහා ඉල්ලුම් කරන තනතුර -

කාර්මික නිලධාරී (III ශ්‍රේණිය) TO

ඕවර්සියර් ගොඩනැගිලි (III ශ්‍රේණිය) BO

| |
|---|
| |

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

විවෘත තරග විභාගයට පෙනී සිටින මාධ්‍යය -

සිංහල S
දෙමළ T
ඉංග්‍රීසි E

| |
|---|
| |

(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න)

1.0 1.1 මුලකුරු සමග සම්පූර්ණ නම :.................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : GUNAWARDHANA, M.G.B.S.K

1.2 මුලකුරු සමග සම්පූර්ණ නම (මයා/මිය/මෙය): ..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................

2.0 2.1 ස්ථිර ලිපිනය :..........................................................................
..........................................................................
2.2 ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : ..........................................................................
..........................................................................
2.3 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ..........................................................................
2.4 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය: ..........................................................................

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1

☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 විවාහක /අවිවාහක බව :
විවාහක - 1
අවිවාහක - 2

☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

5.0 උපන් දිනය : අවුරුද්ද : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

6.0 2026. . දිනට වයස : අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

7.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

8.0 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

9.0 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර : (පිටපත් අමුණන්න.)

9.1 විභාගය සඳහා පෙනී සිටි වර්ෂය සහ මාසය : ..........................................................
9.2 අයදුම්කරුගේ විභාග අංකය : ..........................................................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |
| ..................... | ............ | ..................... | ............ |

10.0 අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර : (පිටපත් අමුණන්න.)

10.1 විභාගය සඳහා පෙනී සිටි වර්ෂය සහ මාසය : ..........................................................
10.2 අයදුම්කරුගේ විභාග අංකය : ..........................................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| ..................... | ............ |
| ..................... | ............ |
| ..................... | ............ |
| ..................... | ............ |
| ..................... | ............ |

11.0 අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ වෘත්තීය (පිටපත් අමුණන්න.)

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |

12.0 අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :

..........................................................................................................................................
..........................................................................................

විභාග ගාස්තු සඳහා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත මෙම කොටුවෙහි නොගැලවෙන ලෙස ඇලවිය යුතු ය.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ඔබ සතුව තබා ගැනීම ඉදිරි විමසීම්වලදී ප්‍රයෝජනවත් වනු ඇත.)

13.0 අයදුම්කරුගේ ප්‍රකාශය:

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුසු වීමටත්, තෝරා පත්කර ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව දනිමි.

දිනය ........................

....................................,
අයදුම්කරුගේ අත්සන.

14.0 අත්සන සහතික කිරීම :

මෙහි අත්සන් කරන ලද .............................................. හි පදිංචි .......................................... මයා/මිය/ මෙය මම පෞද්ගලිකව හඳුනන බවත් ඔහුගේ/ ඇයගේ අත්සන ..................... දින මා ඉදිරිපිට තැබූ බවත් සහතික කරමි.

..............................,
සහතික කරන්නාගේ අත්සන.
(නිල මුද්‍රාව)

සහතික කරන්නාගේ :

නම .................................
තනතුර .............................
ලිපිනය .............................
දිනය .................................

15.0 රාජ්‍ය සේවයේ යෙදී සිටින අයදුම්කරුන් සඳහා පමණි :

මෙම අයදුම්කරු වන ............................................................................ මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ ................................................................ වශයෙන් ස්ථිර/ තාවකාලික/ අනියම් සේවකයකු/ සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කල හැකි/ නොහැකි බවත් දන්වමි.

.................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව).

08 - 99

**සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය**

වෛද්‍ය කර්මය සඳහා වූ අතුරු වෛද්‍ය සේවාවේ පුහුණු පාඨමාලා සඳහා සිසුන් බඳවා ගැනීම - 2026

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය කර්මය සඳහා වූ අතුරු වෛද්‍ය සේවාවේ පහත සඳහන් පාඨමාලා සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලබා ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් 2026.08.07 දින සිට 2026.08.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම් කළ හැක්කේ මෙම අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk) ඔස්සේ පමණි.

**1. සැලකිය යුතු යි :**

1.1 එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එක් අයදුම්පතකට වඩා ඉදිරිපත්කර ඇති අයදුම්කරුවන්ගේ සියලු අයදුම්පත් කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. 2019 සිට 2020, 2021, 2022 හා 2023 දක්වා වර්ෂ වලින් අ.පො.ස. (උ. පෙළ) විභාගය සමත් අයෙකුට වුව ද, ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. එවැනි අයදුම්කරුවන්ට තම මනාපය අනුව තෝරාගනු ලබන එක් වර්ෂයකින් පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ හැකි ය. එසේ නොමැතිව වර්ෂ කිහිපයෙන්ම අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වේ නම් එකී සියලු අයදුම්පත් ද කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

1.2 පසුගිය වසර කිහිපයක් තුළ බඳවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කිරීමේ දී එක් සිසුවෙකු විසින් රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද යටතේ විවිධ රාජ්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කිහිපයක ලියාපදිංචිම නිසා, සුදුසුකම් සහිත සිසුන් ගණනාවකට එවැනි එක් අවස්ථාවක් හෝ නොලැබීයාමේ තත්ත්වයක් නිරීක්ෂණය විය. ඊට අමතරව මෙම තත්ත්වය නිසා රජයේ මුදල් අපතේ යාමක් සිදුවන අතරම පාඨමාලාව අවසානයේ දී අපේක්ෂා කළ පුහුණු වෘත්තිකයින් සංඛ්‍යාව නොමැතිවීම නිසා අදාළ ආයතනවල සැළසුම්ගත ඉලක්කයන් ද ඉටුකරගත නොහැකි වේ. එබැවින්, මෙම තත්ත්වය අවම කර සෑම අයදුම්කරුවෙකුට ම එක් අවස්ථාවක් හෝ හිමිකර දීමට අවශ්‍ය ප්‍රතිපාදන මෙම *ගැසට්* නිවේදනයෙහි අංක 6 ඡේදය මගින් ප්‍රකාශයට පත්කර ඇත. ඒ අනුව අංක 6.1 සිට 6.5 දක්වා වන අනුඡේද වලින් සවිස්තරාත්මකව දක්වා ඇති පරිදි නුසුදුසු අයෙකු මේ සඳහා අයදුම් නොකළ යුතු ය. කෙසේ වෙතත්, එවැනි නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවක දී අනාවරණය වුවහොත් ඔවුන්ට විරුද්ධ *ගැසට්* නිවේදනයේ 7.3 අනුඡේදය ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.

1.3 පසුගිය බඳවාගැනීම් වලදී සාවද්‍ය තොරතුරු (සාවද්‍ය විභාග වර්ෂ, විෂයන්, ලබා ඇති ශ්‍රේණි යනාදිය) ඇතුළත් කර අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව නිරීක්ෂණය වූ අතර, සමහර අයදුම්කරුවන් ව්‍යාජ තොරතුරු ඇතුළත් කර සකස් කරන ලද සහතික සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කර ඇති බව ද නිරීක්ෂණය විය. එය බරපතල වරදකි. එබැවින්, කිසිඳු අයදුම්කරුවෙකු තමා විසින් ඉදිරිපත් කරනු ලබන විද්‍යුත් අයදුම්පතට සාවද්‍ය තොරතුරු ඇතුළත් නොකළ යුතු ය. සාවද්‍ය තොරතුරු ඇතුළත් කර ඉදිරිපත් කර ඇති සෑම අයදුම්පතක් ම කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කර, එවැනි අයදුම්කරුවන්ට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කරන අතර ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නාවුන්ගේ අසාධු ලේඛනයට ඇතුළත් කිරීමට ද කටයුතු කරනු ලැබේ.

1.4 සෑම අයදුම්කරුවෙකු විසින්ම පළමුව මෙම *ගැසට්* නිවේදනයේ සහ වෙබ් අඩවියෙහි ඉදිරිපත් කර ඇති විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලුම කරුණු ඉතා හොඳින් කියවා තේරුම්ගෙන මෙම පාඨමාලාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කිරීමට තමන් සුදුස්සෙකු බවට තහවුරු කර ගත යුතු ය. අනතුරුව *ගැසට්* නිවේදනයෙ 8.4 ඡේදයට අනුව ඕනෑම ලංකා බැංකු ශාඛාවකට රු. 1,000/- ක මුදල ගෙවා ලබාගත් රිසිට් පත ද, 10.4, 10.5 හා 10.6 යන ඡේදවල දක්වා ඇති ලේඛන ද සූදානම් කරගෙන අයදුම්පත සම්පූර්ණ කිරීමට කටයුතු කිරීමෙන් ඔබට අයදුම්පත් යොමුකිරීමේ ක්‍රියාවලිය සාර්ථකව සිදුකළ හැකි වේ.

**02.** බඳවා ගැනීමට අදාළ පුහුණු පාඨමාලා සහ පුහුණු කාලසීමාව

අංක 01 වගුව

| *සංකේත අංකය* | *සේවාව* | *පුහුණු පාඨමාලාවේ නම* | *පුහුණු කාලසීමාව* | *පුහුණු පාඨමාලාව හැදෑරිය යුතු භාෂා මාධ්‍යය* |
|---|---|---|---|---|
| 1. | අතුරු වෛද්‍ය සේවාව | දන්ත කාර්මික ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 2. | | මහජන සෞඛ්‍ය පරීක්ෂක | වසර 02 | ඉංග්‍රීසි |
| 3. | | අංගාදේශක හා සෘජුකරණඥ | වසර 02 | ඉංග්‍රීසි |
| 4. | | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරි | වසර 02 | ඉංග්‍රීසි |
| 5. | | පාසල් දන්ත චිකිත්සක | වසර 02 | ඉංග්‍රීසි |
| 6. | | ඛන්තු රේඛන ශිල්පී | වසර 02 | ඉංග්‍රීසි |
| 7. | | ඖෂධ සංයෝජක | වසර 01 | ඉංග්‍රීසි |
| 8. | | විද්‍යුත් නිකර්පණ රේඛන සටහන්කරු | වසර 02 | ඉංග්‍රීසි |

**03.** තනතුරට අදාළ අධ්‍යාපන හා වෙනත් විශේෂ සුදුසුකම් :

අංක 02 වගුව

| *සංකේත අංකය* | *පුහුණු පාඨමාලාව* | *අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම්* | *අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්* | *පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | දන්ත කාර්මික ශිල්පී | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුලුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ (නව නිර්දේශය) 2021 වර්ෂයේ 2022 වර්ෂයේ හා 2023 යන වර්ෂවල විභාගවලින් එකක දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව විෂයයට සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකි ය. |
| 02 | මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී ඉංග්‍රීසි භාෂාව ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 (නව නිර්දේශය) 2021 වර්ෂයේ 2022 වර්ෂයේ හා 2023 යන වර්ෂවල විභාගවලින් එකක දී අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරකදී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි.<br><br>උස අඩි 5යි අඟල් 2ක් හෝ ඊට වැඩි විය යුතු ය. (157.46cm) |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 03 | අංගාදේශක හා සෘජුකරණඥ | දෙවරකට නොවැඩි වාර ගණනක දී විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි සහ සිංහල/ දෙමළ යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 (නව නිර්දේශය) 2021 වර්ෂයේ 2022 වර්ෂයේ හා 2023 යන වර්ෂයේ විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් **භෞතික විද්‍යාව හෝ ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව, සංයුක්ත ගණිතය, රසායන විද්‍යාව යන විෂයන් අතුරින් දෙකක් (03) සහිතව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය |
| 04 | සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරි | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 (නව නිර්දේශය) 2021 වර්ෂයේ 2022 වර්ෂයේ හා 2023 යන වර්ෂයේ විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් **ජීව විද්‍යාව** විෂයයට සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් දෙකක් (02) සහතිව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>අයදුම්කළ හැක්කේ පුරුෂ පක්ෂයට පමණි. |
| 05 | පාසල් දන්ත චිකිත්සක | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළලුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හා 2021,2022 සහ 2023 යන වර්ෂයේ විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව **විෂයයට** සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>අයදුම් කළ හැක්කේ ස්ත්‍රී පක්ෂයට පමණි.<br>උස අඩි 4යි අඟල් 10ක් හෝ ඊට වැඩි විය යුතු ය. (147.3cm)<br><br>අයදුම්කාරියන් අවිවාහක විය යුතු ය. |
| 06 | ඛන්තු රේඛන ශිල්පී | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 (නව නිර්දේශය) හා 2021 වර්ෂයේ හා 2022 සහ 2023 යන වර්ෂ වල විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව **විෂයට** සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් දෙක (02) සහතිව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය |

| සංකේත අංකය | පුහුණු පාඨමාලාව | අ.පො.ස. (සා.පෙළ) සුදුසුකම් | අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් | පුහුණු පාඨමාලාවට අදාළ වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 07 | ඖෂධ සංයෝජක | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 හෝ 2023 යන වර්ෂයේ විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව **විෂයයට** සම්මාන සාමාර්ථ සහිතව භෞතික විද්‍යාව, ජීව විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතුරින් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය |
| 08 | විද්‍යුත් නිකර්පන රේඛන සටහන්කරු | සිංහල භාෂාව/ දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයයකට අවම වශයෙන් සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී **ඉංග්‍රීසි භාෂාව** ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා.පෙළ) සමත් වීම. | 2019 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2019 වර්ෂයේ (නව නිර්දේශය) හෝ 2020 වර්ෂයේ (පැරණි නිර්දේශය) හෝ 2020 (නව නිර්දේශය) හෝ 2021 වර්ෂයේ හෝ 2022 හෝ 2023 යන විභාගවලින් එකක දී අ.පොස. (උ.පෙළ) විභාගයෙන් ජීව විද්‍යාව **විෂයයට** සම්මාන සාමාර්ථ සහිතව රසායන විද්‍යාව භෞතික විද්‍යාව යන විෂයයන් දෙකක් (02) සහිතව විෂයයන් තුනම (03) එක්වරක දී සමත් වීම. | 2026.08.07 වැනි දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.<br><br>ස්ත්‍රී/ පුරුෂ දෙපක්ෂයටම අයදුම් කළ හැකිය |

04. පාඨමාලාවලට තෝරාගැනීමේ ක්‍රමවේදය :

4.1. අතුරු වෛද්‍ය සේවාවේ තනතුරුවලට බඳවා ගැනීමේ පටිපාටිවල හා ඊට වරින් වර සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් බඳවා ගැනීම සිදුකරනු ලබන අතර, අයදුම්කරුවන්ගේ අ.පො.ස. (උ.පෙළ) Z අගය පදනම් කරගෙන, සලකුණු කර ඇති පාඨමාලාවල ප්‍රමුඛතා අනුපිළිවෙළ ද සැලකිල්ලට ගෙන එක් පුහුණු පාඨමාලාවකට පමණක් තෝරාගනු ලැබේ.

4.2 පුරෝකථනය කළ පුරප්පාඩු සංඛ්‍යාව, පුහුණු ධාරිතාවය, පුහුණු පාසල්වල පවතින පහසුකම්, තත්කාලීනව රටේ පවත්නා මූල්‍ය හා වෙනත් විශේෂිත තත්ත්වයන් යනාදී කරුණු පිළිබඳව සැලකිල්ලට ගෙන පුහුණුව සඳහා බඳවාගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලබන අතර, දිවයිනෙන් බඳවා ගැනීමට නියමිත මුළු සංඛ්‍යාව එක් එක් පළාතේ ජනගහනය පදනම් කරගෙන ජන සංඛ්‍යාවට සමානුපාතකව බෙදා එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

4.3. ඉන්පසු එම එක් එක් පළාතෙන් බඳවාගත යුතු සංඛ්‍යාව අදාළ පළාතෙන් එක් එක් විභාගයෙන් අයදුම්කර අවම සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතකව බෙදා අදාළ පළාතෙන් එක් එක් විභාගයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

4.4. අනතුරුව එම එක් එක් විභාගයෙන් බඳවාගත යුතු සංඛ්‍යාව එම විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාවෙන් හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන් අයදුම්කර, අවම සුදුසුකම් සම්පූර්ණ කල අයදුම්කරුවන් සංඛ්‍යාවට සමානුපාතිකව බෙදා අදාළ පළාතෙන් එක් එක් විභාගයට අදාළ එක් එක් විෂයධාරා යටතේ ඉහළම Z අගය ලබා ඇති අයදුම්කරුවන් අතරින් සළකුණු කර ඇති පාඨමාලා අනුපිළිවෙළද සැලකිල්ලට ගෙන පළාත් පදනමින් තේරා ගනු ලැබේ.

4.5. යම් පළාතකට ඉහත සඳහන් පරිදි වෙන් කල පුරප්පාඩු සංඛ්‍යාව එම පළාත සඳහා සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කළ නොහැකි අවස්ථාවල දී එම පුරප්පාඩු සංඛ්‍යාව දිවයිනේ අනෙකුත් පළාත් අතර එම පළාත්වල ජන සංඛ්‍යාවට සමානුපාතිකව නැවත බෙදාහරිනු ලැබේ.

*සටහන -*

(අ) සෑම අයදුම්කරුවෙකුම ඉහත 4.1. ඡේදය අනුව තේරී පත්වන පාඨමාලාවට ඇතුලත් විය යුතු අතර, ඔවුන්ට වෙනත් පාඨමාලාවකට ඇතුළත් වීමට හෝ මාරුවීමට හෝ අවස්ථාව ලබාදෙනු නොලැබේ.

(ආ) එසේම පාඨමාලාවක ලියාපදිංචි නොවන සිසුන් වෙනුවෙන් නැවත වරක් සිසුන් තෝරාගැනීම තුළින් ඔවුන් ඒ ඒ පාඨමාලා අතර, හුවමාරුවීමෙන් මතුවන අර්බුදකාරී තත්ත්වය වැලැක්වීම සඳහා එක්වරක් පමණක් සිසුන් තෝරාගනු ලබන අතර, කිසිදු පාඨමාලාවකට නැවත වරක් සිසුන් බඳවාගනු නොලැබේ.

(ඇ) අවසන් වරට නිකුත් කරන ලද (අංක 2200 හා 2020.10.29) *ගැසට්* නිවේදනයෙහි යෝග්‍යතාව කොටසෙහි සඳහන් සංශෝධනය අනුව,

* සෑම අපේක්ෂකයෙකුම ඕනෑම ප්‍රදේශයකම සේවාව ලබා දීම සඳහා බැඳීසිටිය යුතු ය.
* පුහුණුවෙන් පසු මධ්‍යම රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර පත්වීම් ලදහොත් ඔබ අවම වශයෙන් වසර 10ක සේවාවක් කිරීමට කැමති විය යුතු ය.

05. යෝග්‍යතාව - සෑම අයදුම්කරුවෙකු ම-

5.1. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

5.2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් ද යහපත් කායික සහ මානසික සෞඛ්‍යයකින් ද යුක්ත විය යුතු ය.

5.3. තමන් අයදුම්කරන දිස්ත්‍රික්කය පදිංචි දිස්ත්‍රික්කය ලෙස සලකා බැලීම සඳහා අයදුම්කරු එම දිස්ත්‍රික්කය තුල අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන 2026.08.31 වැනි දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව පදිංචි වී සිටිය යුතු ය. එය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වෙතත් එලෙස අඛණ්ඩ වස 03 ක පදිංචි කාලසීමාව සනාථකළ නොහැකි අයදුම්කරුවන් සඳහා ඔවුන්ගේ පදිංචි දිස්ත්‍රික්කය ලෙස ඔවුන් විසින් අයදුම්කර ඇති දිස්ත්‍රික්කය ලබාදිය නොහැකි අතර, එවැනි අයදුම්කරුවන්ගේ පූර්ව පදිංචි කාලසීමාව පිළිබඳව සළකා බලා ඊළඟ අත්‍යාසන්න වැඩිම කාලසීමාවක් පදිංචිව සිටි දිස්ත්‍රික්කය අයදුම්කරුට හිමි දිස්ත්‍රික්කය ලෙස සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබේ. මේ සඳහා අවශ්‍ය ලේඛණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත අයදුම්කරු විසින් නොපමාව ඉදිරිපත් කළ යුතු ය.

*සටහන -*

යම් අයදුම්කරුවෙකුගේ පියා හෝ මව රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවක මාරු කළ හැකි සේවයක යෙදී සිටීම හේතුවෙන් හෝ වෙනත් නොවැළැක්විය හැකි කරුණක් මත යම් අයදුම්කරුවෙකුට පූර්වාසන්න වසර 03 තුළ පදිංචිය සනාථ කළ නොහැකි අවස්ථාවල දී පිළිගත හැකි හේතු ඉදිරිපත් කළහොත් ඒ පිළිබඳව අවසන් තීරණය සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ගනු ලැබේ.

06. පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුලත් වීමට නුසුදුස්සන්

6.1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ පවත්නා රජයේ විශ්වවිද්‍යාලයක/ රජයේ විශ්වවිද්‍යාල විද්‍යායතනයක අ.පො.ස.(උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා "රජයේ නිදහසේ අධ්‍යාපන වරප්‍රසාද" යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටි අය.

6.2. ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයක අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම් වලින් බඳවාගනු ලබන පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටින අය.

6.3. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ හෝ වෙනත් රජයේ ආයතනයක හෝ අ.පො.ස. (උ.පෙළ) සුදුසුකම්වලින් බඳවාගනු ලබන පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටින අය.

6.4. ඉහත 6.1, 6.2 හා 6.3 යටතේ සඳහන් ආයතනයක පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී සිටින සිසුන් මෙම *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කරගත්ත ද ඔවුන් මේ සඳහා අයදුම් කිරීමට/ ඇතුලත් වීමට සුදුසුකම් නොලබති. තවද *ගැසට්* නිවේදනය පළවීමෙන් පසුව ද/ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට සුදුසුකම් නොලබති.

**6.5. විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අය. (මෙම වගන්ති අවශ්‍ය වන්නේ පාසල් දන්ත චිකිත්සක පාඨමාලා පමණි.)**

**07. වෙනත් කරුණු**

7.1. ඔබ යම් විශ්වවිද්‍යාලයක උපාධියක් සම්පූර්ණ කර සිටින අයෙක් නම්, එම උපාධිය බලපැවැත්වෙන

දිනය (Effective date) මෙම පාඨමාලාවට අයදුම්පත් කැඳවීමේ දිනට එනම් 2026.08.07 දිනට පෙර දිනයක් විය යුතු ය.

7.2. ඉහත කොන්දේසි සියල්ල සම්පූර්ණ කර තිබුණ ද අනිවාර්යයෙන්ම ඔබ අයදුම් කරන පාඨමාලාව/ පාඨමාලා සඳහා ඇතුළත් කර ගන්නේය යන්න මෙම *ගැසට්* නිවේදනයේ කුමන හෝ වගන්තියක් මගින් අදහස් නොකෙරෙන බව තරයේ සිහි තබා ගත යුතු ය. එමෙන්ම ඉහත කොන්දේසි සම්පූර්ණ කර තිබිණ ද, සුදුසුකම් ලැබීමට ප්‍රමාණවත් Z අගයක් ලබා නොමැති නම් හෝ මෙහි සඳහන් අනෙකුත් කුමන හෝ කොන්දේසියක් සම්පූර්ණ කර නොමැති නම් කිසිදු අයුරකින් මෙම පාඨමාලා සඳහා සුදුසුකම් නොලබන බව ඔබ දැනගත යුතු ය.

7.3. ඉහත 6.1., 6.2. හා 6.3. යටතේ සඳහන් ආයතනයක පූර්ණකාලීන පාඨමාලාවක ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටින අයෙකු හෝ 6.4. හා 6.5. ඡේදවල දක්වා ඇති නුසුදුසුකම් පවතින අයෙකු මේ සඳහා අයදුම්කර, පසු අවස්ථාවකදී අනාවරණය වුවහොත් අදාළ පාඨමාලාවෙන්/ තනතුරෙන් ඉවත්කර ඒ වනතෙක් ඔවුන් වෙනුවෙන් රජය විසින් දරා ඇති සියලුම වියදම් අයකර ගැනීමට ද ඔවුන්ගේ නම් නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඇතුලත් කිරීමටද කටයුතු කරනු ලැබේ.

7.4. සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම අධ්‍යාපන හා අනෙකුත් සහතිකවල වලංගු දිනය අයදුම්පත් ඉදිරිපත් කිරීමේ අවසන් දිනය වන 2026.08.31 දින හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.

7.5. තවද, යම් පාඨමාලාවකට *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් නොමැතිව අයදුම් කිරීමෙන් පසු, එමගින් අයදුම්කරුට සිදුවන අපහසුතා පිළිබඳව මෙම අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නොලැබේ.

08. අයදුම් කළ යුතු ක්‍රමය :

8.1. ඉහත පුහුණු පාඨමාලා සඳහා අයදුම්කළ යුත්තේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය (www.health.gov.lk)මගිනි. ඒ සඳහා මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ අදාළ කොටසේ ඇති අයදුම්පත සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා අපගේ වෙබ් අඩවියෙහි මෙම *ගැසට්* නිවේදනය සමග ඉදිරිපත් කර ඇති උපදෙස් පත්‍රිකාව බලන්න.

8.2. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ ඉංග්‍රීසි භාෂාවෙන් පමණි.

8.3. ඉහත පාඨමාලා සඳහා ඔබ විසින් මූලික සුදුසුකම් සපුරා ඇත්නම්, ඔබට එක් පාඨමාලාවකට හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවකට හෝ අයදුම්කළ හැකිය. එලෙස ඔබ පාඨමාලා දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් සඳහා අයදුම් කරන්නේ නම්, වෙබ් අඩවියේ දැක්වෙන අයදුම්පතෙහි ඔබගේ මනාපයට අනුව ප්‍රමුඛතා අනුපිළිවෙලට ඒ ඒ පාඨමාලා තෝරා ගත යුතු ය. එලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත උඩුගත කිරීමෙන් පසු එහි ඔබගේ මනාපයට අනුව තෝරාගෙන සලකුණු කර ඇති පාඨමාලා අනුපිළිවෙල වෙනස් කිරීමට හෝ තෝරාගෙන ඇති පාඨමාලා අතරින් එකක් හෝ කිහිපයක් ඉවත්කර ගැනීමට හෝ නව පාඨමාලාවක් හෝ කිහිපයක් ඇතුළත් කිරීමට හෝ කිසිඳු අවස්ථාවක දී කිසිඳු කරුණක් මත ඉඩ දෙනු නොලැබේ.

8.4. අයදුම්කරුවන් රු. 1000/- ක මුදලක් ලංකා බැංකුව, තැපැල් ශාඛාවේ අංක 7041318 දරණ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ විභාග ගාස්තු රැස්කිරීමේ ගිණුමට ගෙවිය යුතු ය. සෑම අයදුම්කරුවෙකුම මෙම මුදල අයදුම්පත ඉදිරිපත් කිරීමට පෙර ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා ලැබෙන රිසිට් පතෙහි මුද්‍රිත අංකය අයදුම්පතේ අදාළ ස්ථානයට ඇතුළත් කිරීමෙන් පසුව පමණක් තම අයදුම්පත අන්තර්ජාලය ඔස්සේ ඉදිරිපත් කළ යුතු ය. මෙම ගෙවීම මුදල් තැන්පත් කිරීමේ යන්ත්‍රයකින් හෝ අන්තර්ජාල බැංකු සේවාවක් මගින් සිදු නොකළ යුතු ය. මෙම ගාස්තු කවර හේතුවක් නිසා හෝ ආපසු නොගෙවන අතර, වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද ඉඩ දෙනු නොලැබේ. ඔබ විසින් උක්ත ගෙවීමට අදාළ සාක්ෂි (රිසිට් පත) සුරක්ෂිතව තබාගත යුතු අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගි වුවහොත් එය අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතු ය. ඒ අනුව අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු ගෙවීම් සිදුකර ඇති බවට නිරීක්ෂණය වන අයදුම්කරුවන් සහ රිසිට්පතක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මේ සඳහා බඳවාගැනීමට නුසුදුස්සන් සේ සලකා කටයුතු කරනු ලැබේ.

8.5. ඉදිරිපත් කරන ලද විද්‍යුත් අයදුම්පතෙහි පිටපත සහ අංක 05 කින් යුත් කේතය ලබාගැනීම.

(අ). මෙම *ගැසට්* නිවේදනයේ සහ ඒ සමගම විද්‍යුත් අයදුම්පත සම්පූර්ණ කිරීම සඳහා වෙබ් අඩවියෙහි පළකර ඇති උපදෙස් පත්‍රිකාවේ සඳහන් සියලු කරුණුවලට අනුව සාර්ථකව අයදුම්පතක් ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුටම තම අයදුම්පත විධිමත් පරිදි යොමු වූ වහාම එහි පිටපතක් සහ තමාටම අනන්‍ය වූ අංක 05කින් යුත් කේතයක් ලැබේ.

(ආ) සෑම අයදුම්කරුවෙකු විසින්ම එලෙස පරිසණක තිරයේ දිස්වන තම අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (PrintOut) ලබාගත යුතු ය. එය තැපැල් මගින් එවීමට අවශ්‍ය නොවේ. අයදුම්පතක් ඉදිරිපත් කළ සෑම අයදුම්කරුවෙකුටම තමා මේ සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ බව තහවුරු කිරීම සඳහා පවතින විධිමත් සහ එකම සාක්ෂිය මෙම පිටපත බැවින් එය සුරක්ෂිතව තබා ගැනීම ඔබ සතු වගකීමකි. ඊට අමතරව අංක 05 කින් යුත් කේතය ද සුරක්ෂිතව තබාගැනීමෙන් ඔබ විසින් ඉදිරිපත් කළ අයදුම්පතේ පිටපත් පසුව ලබාගත හැකිය.

(ඇ) යම් අවස්ථාවක තම අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු එහි පිටපතක් හෝ අංක 05 කින් යුත් කේතයක් නොලැබෙන අයදුම්කරුවන් වේ නම්, ඔවුන්ගේ අයදුම්පත් නිසි පරිදි උඩුගත වී/ ඉදිරිපත් වී නොමැති බව වටහා ගත යුතු ය. එවැනි සියලු දෙනාම අයදුම්පත් ඉදිරිපත් නොකල සිසුන් ලෙස සලකනු ලැබේ. ඒ අනුව එවැනි අයදුම්කරුවෙකු කඩිනමින් පහත 8.6. (අ) ඡේදයේ දක්වා ඇති දුරකථනය හෝ/ සහ විද්‍යුත් තැපැල හරහා මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකය සමග සම්බන්ධ වී තම අයදුම්පත පිළිබඳ ගැටලුව 2026.08.31 දිනට පෙර විසඳා ගෙන තමාට අයත් කේතය හා අයදුම්පතෙහි පිටපත ලබාගැනීමට කටයුතු කළ යුතු අතර, මෙම කාර්යය සම්පූර්ණයෙන්ම අයදුම්කරු සතු වගකීමක් බවද අවධාරණය කරමි. කෙසේ වෙතත්, විධිමත් පරිදි මෙම අමාත්‍යාංශය වෙත යොමු වී නොමැති විද්‍යුත් අයදුම්පත් සම්බන්ධයෙන් 2026.08.31 දිනෙන් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ද කිසිසේත් සලකා බලනු නොලැබේ.

(ඈ) තවද, අයදුම්කරුවෙකු විසින් මෙම බඳවාගැනීමට අදාළ කිසියම් කරුණක් සම්බන්ධයෙන් කරනු ලබන සෑම ඉල්ලීමක් සමගම තම අයදුම්පතක් එවිය යුතු අතර, එය නොමැතිව ඉදිරිපත් කරනු කිසිදු ඉල්ලීමක් පිළිබඳව සලකා බලනු නොලබන බවද වැඩිදුරටත් අවධාරණය කරමි.

8.6. අත්‍යාවශ්‍ය තොරතුරු දැනගැනීම සඳහා විමසීම්

(අ) මෙම පාඨමාලාව සඳහා අයදුම්කිරීමට සියළු සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අයදුම්පත සම්පූර්ණ කිරීමේදී කිසියම් ගැටලුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා හෝ ඉහත 8.5 (ඇ). ඡේදයේ දැක්වෙන ගැටලුවක් නිරාකරණය කර ගැනීම සඳහා පමණක් සතියේ වැඩකරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව.4.00 දක්වා කාලය තුළ** සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ ඒකකයේ දුරකථන අංක 0112 340 007 අමතන්න. hrcodmoh@gmail.com විද්‍යුත් තැපෑල ලිපිනයෙන්ද සම්බන්ධ විය හැකිය. (විද්‍යුත් තැපැල ඔස්සේ සම්බන්ධ වන සෑමවිටම එහි ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය සහ දුරකථන අංකයක් සඳහන් කිරීම අනිවාර්ය වේ.)

(ආ). අදාළ සියළු තොරතුරු මෙම *ගැසට්* නිවේදනය හි සහ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශ https://www.health.gov.lk වෙබ් අඩවියෙ හි සවිස්තරව දක්වා ඇති බැවින්, වෙනත් කරුණු පිළිබඳව විමසීමෙන් වලකින්න.

09. අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම :

9.1. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු/ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු/ රජයේ විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චය කාරවරයෙකු/ නීතිඥවරයෙකු හෝ වර්ෂයකට රු. 854,880/-කට නොඅඩු වැටුපක් ලබන ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන රජයේ නිලධාරියෙකු විසින් අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය.

9.2. මෙම *ගැසට්* නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන හෝ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණය සඳහා ඔබව කැඳවනු ලැබුවහොත් ඉදිරිපත් කළ යුතු තොරතුරු :

10.1. ඔබ විසින් සාර්ථකව උඩුගත කර ඇති විද්‍යුත් අයදුම්පත අනුව අවම අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතුරින් Z අගය අනුව සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයක් පදනම් කරගෙන තෝරාගත් පිරිසක් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ඒ ඒ තනතුරට අදාළ බඳවා ගැනීමේ පරිපාටිවල සහ මෙම *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් හා කායික යොග්‍යතාව පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අයදුම්කරුවන් විසින් පහත සඳහන් ලිපි ලේඛනවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

නොවැළැක්විය හැකි හේතුවක් මත (සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පිළිගතහැකි) කිසියම් අයදුම්කරුවෙකුට කිසියම් සහතිකයක්/ ලේඛනයක් එදිනට ඉදිරිපත් කිරීමට නොහැකි වුවහොත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ උපදෙස් පරිදි එකී සහතික/ ලේඛන සම්මුඛ පරීක්ෂණ දිනයේ සිට දින 07 ක් ඇතුළත මෙම අමාත්‍යාංශයේ මානව සම්පත් කළමනාකරණ හා සම්බන්ධීකරණ අංශය වෙත පැමිණ භාරදිය යුතු අතර, එසේ නොකරන සියලු අයදුම්කරුවන් මේ සඳහා තෝරාගැනීමට නුදුසුස්සන් සේ සළකා කටයුතු කරනු ලැබේ.

10.2. විද්‍යුත් මාධ්‍යයෙන් උඩුගත කරන ලද (upload) අයදුම්පතෙහි මුද්‍රිත පිටපත (9.1 ඡේදයේ දක්වා ඇති නිලධාරියෙකු ලවා සහතික කරන ලද)

10.3. උප්පැන්න සහතිකය

10.4. අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල හා Z අගය දැක්වෙන සහතිකය (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ)

10.5. අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනය. (විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ)

10.6. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු දේශීය රියදුරු බලපත්‍රය.

10.7. රු. 1000/- ක මුදල ගෙවූ බවට සනාථ කෙරෙන රිසිට්පත

10.8. පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය

10.9. ශිෂ්‍ය කාර්ය දර්ශනය (පාසල් හැරයාමේ සහතිකය - අධ්‍යාපන බී 59 පොදු ආකෘති පත්‍රය)

10.10 ඉහත අංක 6.5 අනු ඡේදයෙහි දක්වා ඇති පරිදි විවාහය ලියාපදිංචි කර ඇති හෝ දික්කසාද වූ හෝ අයෙකු නොවන බව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ රු. 50- ක මුද්දරයක් මත අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශය. (මෙම වගන්තිය අවශ්‍ය පාසල් දත්ත විකිත්සක වැනි අදාළ තනතුරු තිබේ නම් පමණකි)

10.11 ඉහත අංක 6 ඡේදයෙහි 6.1 සිට 6.4 දක්වා වූ අනු ඡේදවලින් විස්තර කර ඇති පරිදි නුසුදුසුකම් නොපවතින අයෙකු බව සනාථ කිරීම සඳහා වන බහුමාන සහතිකය.

*සටහන :-*

(අ) <u>**ඉහත 10.2 සිට 10.11**</u> දක්වා වන ඡේදවල සඳහන් ලේඛනවල තමා විසින්ම සහතික කරන ලද ඡායා පිටපත්, සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වීමේ දී රැගෙන ආ යුතු ය.

(ආ) පුහුණු පාසල්වල පවතින ඉඩ පහසුකම් හා සේවා අවශ්‍යතාව අනුව පුහුණුවට බඳවාගත යුතු සංඛ්‍යාව හා සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන් සංඛ්‍යාව හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

(ඇ) සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන සියලු දෙනාම පුහුණුවට බඳවා ගන්නා බවක් මෙහි අඩංගු කිසිඳු වගන්තියකින් අදහස් නොකෙරේ.

(ඈ) සම්මුඛ පරීක්ෂණයෙන් පසු තෝරාගත් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු http://www. health.gov.lk මෙම අමාත්‍යාංශයිය **වෙබ් අඩවියේ පළකරනු ලබන අතර කිසිවෙකුට පෞද්ගලිකව දැනුම් දෙනු නොලැබේ.** කෙසේ වෙතත්, අවස්ථානුකූලව පැනනගින විශේෂිත තොරතුරු පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය වුවහොත්, ඒවා ඔබ විසින් අයදුම්පත සමග ඉදිරිපත් කර ඇති දුරකථන අංක සහ/හෝ විද්‍යුත් තැපැල් ලිපිනය ඔස්සේ සිදුකරනු ලැබේ. එබැවින්, අයදුම්පත සමග ඉදිරිපත් කරන ලද දුරකථන අංක සහ විද්‍යුත් තැපැල් ලිපිනය නොවෙනස්ව, සක්‍රියව තබාගැනීම ඔබගේ වගකීමක් වන අතර, ඒවායේ වෙනස්වීම් මත හෝ අක්‍රියව පැවතීම මත අදාළ තොරතුරු නිසි කලට සංනිවේදනය නොවීම නිසා සිදුවිය හැකි ගැටලු සහගත තත්ත්වයන් සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශය වගකියනු නොලැබේ.

(ඉ) *ගැසට්* නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් නියමිත පරිදි පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූවන් විසින් හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වී නියමිත දිනට ලියාපදිංචි නොවූ අයදුම්කරුවන් විසින් හෝ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමෙන් පසුව පාඨමාලාවට ඇතුළත් වීම සඳහා ඉදිරිපත් කරනු ලබන අභියාචනා කිසිඳු හේතුවක් මත සලකා බලනු නොලැබේ.

**11. පුහුණු කිරීමේ පරිපාටිය :**

11.1 සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව තෝරාගනු ලබන අයදුම්කරුවන් මෙම පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පුහුණු පාසල්වලට ඇතුළත් කරනු ලැබේ. පාඨමාලා කාලය සහ හැදෑරිය යුතු භාෂා මාධ්‍යය අංක I වගුවේ දක්වා ඇත.

11.2 පුහුණු පාසල්වලට ඇතුළත් කරනු සිසුන් ඒවායේ හි බලපැවැත්වෙන නීතිරීතිවලට හා සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට මගින් කලින් කලට පනවනු ලබන වෙනත් නියෝගවලට ද යටත් වනු ඇත.

11.3 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ නියමිත විභාගවලින් අසමත් වන හෝ වැඩ හා හැසිරීම අසතුටුදායක වන හෝ විභාග, නිවාඩු කොන්දේසි පිළිපැදීමට අපොහොසත්වන හෝ පුහුණුවට බඳවාගැනීම සඳහා ඉදිරිපත් කර තිබෙන අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් අසත්‍ය බවට අනාවරණය වන හෝ සිසුන්ගේ පුහුණුව ඕනෑම අවස්ථාවක දී වන්දි ගෙවීමකින් තොරව අවසන් කළ හැකි ය.

11.4 පුහුණුව ලබන කාලපරිච්ඡේදය තුළ දී සිසුන්ට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි උපලේඛන VI හි විධිවිධානවලට අනුව මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

11.5 පුහුණු පාසලට ඇතුළත් කරනු ලබන අවස්ථාවේ දී පුහුණුව සාර්ථකව නිම කරන බවටත්, පාඨමාලාව අත්හැර නොයන බවටත්, පුහුණුව සම්පූර්ණයෙන් ම නිම කිරීමෙන් පසු අදාළ තනතුරේ පත්වීම් ලද හොත් අවම වශයෙන් වසර දහයක (10) කාලපරිච්ඡේදයක් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවය යටතේ සේවය කරන බවටත්, <u>සොබ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන නිලධාරියෙකු සමඟ ගිවිසුමකට එළඹිය යුතු අතර, ඔබගේ පුහුණුව හා අනිවාර්ය සේවා කාලය සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් ඉදිරිපත් කරනු ලබන ඇපකරයට පිළිගත් ඇපකරුවන් දෙදෙනෙකු සහිතව එළඹිය යුතු ය.</u> ඉහත 11.3 කරුණු ප්‍රකාරව, පුහුණු කාලසීමාව තුළ දී පුහුණුවෙන් ඉවත්වන, පුහුණුව හැරයන, පුහුණුවෙන් ඉවත් කිරීමට සිදුවන හෝ පත්වීම් ලැබ වර්ෂ දහයක (10) කාලපරිච්ඡේදය ඉහත අදාළ තනතුරේ සේවය කිරීමට අපොහොසත් වන සිසුන් පුහුණුවෙන්/ තනතුරෙන් ඉවත්කරන අතර අදාළ කාලය තුළ දී ඔවුන් වෙත රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත මුදල සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට ගෙවිය යුතු ය. එසේ නොමැති වුවහොත්, එම මුදල් අයකරගැනීමට ගිවිසුම් ප්‍රකාරව හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පියවනු ගනු ඇත.

11.6 පාසල් දන්ත චිකිත්සක පුහුණුවට අයදුම්කරන අයදුම්කාරියන් අයදුම්පත් එවන දිනය වනවිට අවිවාහක විය යුතු අතර, පුහුණුව ලබන කාල සීමාව තුළ දී ද අවිවාහකව සිටීම අනිවාර්යය වේ.

**12. සේවයේ නියුක්ත කරවීමේ නියමයන් :**

12.1 පුහුණුව අවසානයේ ස්ථිර පත්වීම් ප්‍රදානය කිරීමට රජය බැඳී නොසිටී. එහෙත්, පුහුණුව අවසන් කරන දිනය වන විට පවත්නා පුරප්පාඩු මත සකස් කරන ප්‍රමුඛතා පුරප්පාඩු ලේඛනය අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත ස්ථාන මාරු ලබා දීමෙන් අනතුරුව ඉතිරිවන පුරප්පාඩු සඳහා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කරන සිසුන්ගේ අවසන් පරීක්ෂණ කුසලතාවය සැළකිල්ලට ගෙන අදාළ තනතුරේ III වන ශ්‍රේණියේ තනතුරකට පත් කිරීම සඳහා සලකා බලනු ලැබේ. එලෙස තෝරා ගනු ලබන සිසුන් පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා බැඳී සිටිය යුතු ය.

12.2 එකී පත්වීම්ලාභීන් වෙත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

12.3 අයදුම්පත සම්පූර්ණ කිරීමේ දී හා වෙනත් සුදුසුකම් නිවැරදිව කළ යුතු ය. පුහුණුව සඳහා බඳවාගැනීමෙන් හෝ පත්වීම් ලැබීමෙන් පසුව හෝ ඉහත කී සහතික ව්‍යාජ බවට ඔප්පු වුවහොත් නීත්‍යානුකූලව කටයුතු කිරීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමටත්, දෙනු ලබන පත්වීම අවලංගු කර පුහුණුවෙන්/තනතුරෙන් පහ කරන අතර, ඒ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කර නැවත රජයේ සේවයට නොගන්නවුන්ගේ අසාධු ලේඛනයට ඔවුන්ගේ නම් ඇතුළත් කිරීමටත් කටයුතු කරනු ලැබේ. තව ද, පුහුණු කාලය තුළ දී රජය විසින් ගෙවන ලද දීමනා, දරන ලද වියහියදම් හා ගිවිසුම්ගත අදාළ මුදල අයකර ගැනීමට ද කටයුතු කරනු ලැබේ.

12.4 තෝරාගත් අයදුම්කරුවන් පාඨමාලාව හැදෑරීමට හා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායික හා මානසික යෝග්‍යතාවයකින් හෙබි බව සනාථ කරනු පිණිස පුහුණුවේ පළමු මාසය ඇතුළත වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, වෛද්‍ය පරීක්ෂණයේ දී අයෝග්‍ය බව පෙනී යන අයදුම්කරුවන් පාඨමාලාවේ රැඳී සිටීමට නුසුදුස්සන් වනු ඇත.

12.5 ඉහත පරිදි බඳවා ගන්නා ලද සියලුම දෙනා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානයන්ට, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් රජයේ සේවය සම්බන්ධව පනවන ලද රීති, රෙගුලාසි හා නියෝගවලට, සේවා ව්‍යවස්ථාවල විධිවිධානයන්ට, රජයේ මුදල් රෙගුලාසි වලට, රජයේ චක්‍රලේඛ හා උපදෙස්වලට හා ඒවාට අදාළ වරින්වර

පනවනු ලබන නියමවලට හා සංශෝධනවලට ද යටත් වනු ඇත.

12.6 පාඨමාලාවලට බඳවාගනු ලබන සිසුන් සඳහා පුහුණු පාසල්වලට නේවාසික පහසුකම් සැපයීමට මෙම අමාත්‍යාංශය බැඳී නොසිටී. එසේ ලබාදෙන්නේ නම්, ඒ සඳහා අදාළ තක්සේරු නිවාස කාමර කුළිය, ජල හා විදුලි බිල්පත් ගාස්තු අය කරනු ලැබේ.

12.7 පුහුණු කාලසීමාව තුළ දී සිසුන්ට වෘත්තීය සමිති කටයුතුවල නිරතවීම හෝ පෞද්ගලික සේවයේ යෙදීමට හෝ කිසිඳු අයිතිවාසිකමක් නොමැත.

12.8 පාඨමාලාවට බඳවාගැනීම සම්බන්ධයෙන් මෙම *ගැසට්* නිවේදනය මගින් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ත්වයක් උදා වුවහොත්, ඒ පිළිබඳ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

**වෛද්‍ය අනිල් ජාසිංහ,**
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

2026 ජූලි මස 30 වැනි දින,
"සුවසිරිපාය",
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ - 10.

08 - 59